

වාර්ෂික කාර්ය සාධනය සහ ගිණුම් 2013

Annual Performance and Accounts 2013

வருடாந்த முன்னேற்ற மற்றும் கணக்கு அறிக்கை - 2013

පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

Ministry of Environment and Renewable Energy

சுற்றாடல் மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சு

දැක්ම

සෞඛ්‍ය සම්පන්න සහ
සුඛදායී තිරසාර පරිසරයක් ලබාදීම

මෙහෙවර

වර්තමාන සහ අනාගත පරම්පරාවන්ගේ සුභ සිද්ධිය උදෙසා
ධරණීය සංවර්ධනයක් ඇති කිරීම සඳහා වන ජාතික කැපවීම සහතික කරනු වස්
පරිසර හා ස්වභාවික සම්පත් කළමනාකරණයට නායකත්වයක් ලබා දීම

අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්ය භාරය

- ප්‍රතිපත්ති සම්පාදනයෙහි ලා උපයෝගී කර ගැනීම පිණිස පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් පරිසර හා ස්වභාවිත සම්පත් ක්ෂේත්‍ර තුල ඇති ගැටළු හඳුනා ගැනීම සහ විශ්ලේෂණය කිරීම
- පරිසර හා ස්වභාවික සම්පත් සංරක්ෂණයට අදාලව ප්‍රතිපත්ති සම්පාදනය කිරීම අදාල පාර්ශ්වකරුවන්ට දැනුම් දීම සහ ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම
- පරිසර හා ස්වභාවික සම්පත් සංරක්ෂණ ප්‍රතිපත්ති පිළිබඳ උපාය මාර්ගික පරිසර ඇගයීම් සිදු කිරීම
- සංවර්ධන ක්‍රියාවලියේ දී පරිසර තිරසාර බව තහවුරු කිරීම් වස් පරිසර ප්‍රතිපත්තියට අනුකූලව අනිකුත් ක්ෂේත්‍ර ප්‍රතිපත්ති සැකසීමට පියවර ගැනීම
- එක් පාර්ශ්වයක් ලෙස ශ්‍රී ලංකාව විසින් අත්සන් තබා ඇති බහු පාර්ශ්වික පාරිසරික සම්මුතීන්ගෙන් පැන නගින ශ්‍රී ලංකාව විසින් ඉටු කළ යුතු ජාත්‍යන්තර බැඳීම් ඉටු කිරීම තහවුරු කිරීම
- පරිසර හා ස්වභාවික සම්පත් වලට අනුකූල වූ ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි උපාය මාර්ග හා ක්‍රියාකාරී සැළසුම් පිළියෙළ කිරීම
- පරිසර හා ස්වභාවික සම්පත් ක්ෂේත්‍රයට අදාල නව ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම පිණිස නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- පරිසර හා ස්වභාවික සම්පත් ක්ෂේත්‍රයට අදාල පසු විපරම් කිරීමේ ක්‍රමවේදයන් සැකසීම සහ පසු විපරමෙන් ලැබෙන තොරතුරු මත පරිසර කළමනාකරණය සඳහා සුදුසු ක්‍රමෝපායයන් යෙදීම
- ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමේ දී පරිසරයට සිදුවන බලපෑම් පිළිබඳ පර්යේෂණ පැවැත්වීම, තොරතුරු විශ්ලේෂණය කිරීම, එම තොරතුරු මහජනතාව ඇතුළු අදාල අංශ වලට යොමු කිරීම
- යහපත් වූ පරිසර කළමනාකරණයක් සඳහා රාජ්‍ය සහ දේශපාලන අංශ වල කැපවීම සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම
- පරිසර හා ස්වභාවික සම්පත් වලට අදාල ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ සහ වෙනත් ප්‍රධාන පාරිසරික ක්‍රියාදාමයන් පිළිබඳව ජාතික මට්ටමෙන් ජනතාව දැනුවත් කිරීම
- පරිසර හා ස්වභාවික සම්පත් වලට අදාල ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලබන්නන් සහ අනිකුත් පාර්ශ්වකරුවන්ගේ ධාරිතාවය ශක්තිමත් කිරීම
- බලශක්ති සුරක්ෂිතතාවය තහවුරු කරනු වස් රට තුල සුනිත්‍ය බල ක්ෂේත්‍රය දිරිමත් කිරීම

පටුන

	පිටු අංකය
1. හැඳින්වීම	6
2. 2013 වර්ෂයේ පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් ඉටු කරන ලැබූ ක්‍රියාකාරකම් වල ප්‍රගතිය	8
2.1 සැමට පිවිතුරු වාතය නම් වූ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ඉටු කර ඇති මූලික කාර්යයන්	8
2.2 ශාක සත්ව හා පරිසර පද්ධති සුරැකීමේ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ඉටු කර ඇති මූලික කාර්යයන්	10
2.3 දේශගුණ විපර්යාස අභියෝග ජය ගැනීම නම් වූ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ඉටු කර ඇති මූලික කාර්යයන්	17
2.4 වෙරළ තීරය හා අවට මුහුද ඥනාන්විත ලෙස පරිහරණය නම් වූ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ඉටු කර ඇති මූලික කාර්යයන්	23
2.5 ඥානාන්විත ඉඩම් පරිහරණය නම් වූ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ඉටු කර ඇති මූලික කාර්යයන්	24
2.6 කසලින් තොර වටපිටාවක් නම් වූ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ඉටු කර ඇති මූලික කාර්යයන්	26
2.7 සැමට සැමදා ජලය නම් වූ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ඉටු කර ඇති මූලික කාර්යයන්	27
2.8 සෞඛ්‍ය හා සමෘද්ධීය උදෙසා හරිත නගර නම් වූ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ඉටු කර ඇති මූලික කාර්යයන්	28
2.9 කර්මාන්ත හරිතකරණය නම් වූ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ඉටු කර ඇති මූලික කාර්යයන්	29
2.10 නිවැරදි තෝරා ගැනීම සඳහා දැනුම නම් වූ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ඉටු කර ඇති මූලික කාර්යයන්	31
3. ජාත්‍යන්තර සහයෝගිතාවය	38
4. මූල්‍යමය විශ්ලේෂණය	42
5. අමාත්‍යාංශයේ අමාත්‍ය මණ්ඩල සංදේශ - 2013	43
6. 2013 ගිණුම්	49

පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන

- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- මධ්‍යම පරිසර අධිකාරිය
- සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
- රාජ්‍ය දැව සංස්ථාව
- භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
- ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
- මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය
- සුනිත්‍ය බල ශක්ති අධිකාරිය

1. හැඳින්වීම

වර්තමාන වර්ෂයේ මැද භාගයේ දී ඊට පෙර වර්ෂයේ අත්පත් කර ගන්නා ලද ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම රජයේ සියළුම ආයතන විසින් ඉටු කළ යුතු වගකීමකි. මෙම අවශ්‍යතාවය ඉටු කිරීම සඳහා පරිසර කළමනාකරණය හා ස්වභාවික සම්පත් සංරක්ෂණය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදනයෙහි ලා ප්‍රමුඛත්වය දරණ පරිසර හා පුනර්ජනනීය බල ශක්ති අමාත්‍යාංශය ‘‘වාර්ෂික කාර්ය සාධනය සහ ගිණුම් - 2013‘‘ යන නමින් මෙම වාර්තාව ඉදිරිපත් කරනු ලබයි. මෙම වාර්තාව මගින් පරිසර හා පුනර්ජනනීය බල ශක්ති අමාත්‍යාංශය විසින් 2013 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද වැඩ සටහන් හා ක්‍රියාකාරකම්වල අත්පත් කර ගන්නා ලද ප්‍රගතිය ඉදිරිපත් කරනු ලබයි. අමාත්‍යාංශයේ පරිසර හා ස්වභාවික සම්පත් අංශයේ නිරත සියළුම පාර්ශ්වකරුවන් ගේ සහභාගිත්වයෙන් සකසන ලද ‘‘හරිත ලංකා‘‘ වැඩ සටහනෙහි එක් එක් මෙහෙවර / තේමාන්විත ක්ෂේත්‍ර යටතේ 2013 වර්ෂයේ දී අත්පත් කර ගන්නා ලද ප්‍රගතිය දක්වා ඇත.

තිරසාර සංවර්ධනය සඳහා වූ ඉලක්ක අත්පත් කර ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ සියළු ප්‍රතිපත්ති සැකසීමට අවශ්‍ය වන්නා වූ උපදෙස් මාලාවක් රටේ සංවර්ධන රාමුව වන ‘‘මහින්ද චින්තන - ඉදිරි දැක්ම‘‘ මගින් පැහැදිලිව පෙන්වා දෙයි. මෙකී ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුගත වන පරිදි ශ්‍රී ලංකාවේ පරිසර හා ස්වභාවික සම්පත් ක්ෂේත්‍රයන් හි පවතින බාධක හා අභියෝග ජය ගැනීම සඳහා ප්‍රගති වාර්තා කරන කාල සීමාව තුළදී අමාත්‍යාංශයෙන් හා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන මගින් ව්‍යාපෘති හා වැඩ සටහන් ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී. ‘‘මහින්ද චින්තන ඉදිරි දැක්ම‘‘ ජාතික ආර්ථික සංවර්ධන ප්‍රතිපත්තියෙහි සඳහන් අභිමතාර්ථයන් ළඟා කර ගැනීම අරමුණු කර ගනිමින් පරිසර ආරක්ෂණය සහ කළමනාකරණය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති , උපාය මාර්ග සහ වැඩසටහන් සැකසීමත් එම ප්‍රතිපත්ති සහ වැඩ සටහන් උපක්‍රමික ලෙස ක්‍රියාවට නැංවීමත් පරිසර හා පුනර්ජනනීය බල ශක්ති අමාත්‍යාංශය ආරම්භ කර ඇත. තවද පරිසර හා පුනර්ජනනීය බල ශක්ති අමාත්‍යාංශය විසින් දැනට ‘‘හරිත ලංකා‘‘ වැඩ සටහන වශයෙන් හැඳින්වෙන ජාතික පාරිසරික ප්‍රතිපත්ති හා උපාය මාර්ග ‘‘මහින්ද චින්තන ඉදිරි දැක්ම‘‘ ට අනුකූල වන පරිදි යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලියෙහි නිරත වී ඇත.

රජය විසින් ගන්නා ලද තීරණයකට අනුව පරිසර අමාත්‍යාංශය 2013 වර්ෂයේ සිට පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය ලෙස නම් කර ඇති අතර එහි කාර්යභාරයට පුනර්ජනනීය බල ශක්ති ක්ෂේත්‍රය අන්තර්ගත කර ඇත. ඒ අනුව සුනිත්‍ය බලශක්ති අධිකාරිය පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

අමාත්‍යාංශය විසින් පරිසර හා ස්වභාවික සම්පත් සංරක්ෂණය සඳහා විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරනු ලබන අතර පහත වගුවෙහි හරිත ලංකා වැඩ සටහනෙහි එක් එක් මෙහෙවර යටතේ ඉටු කර ඇති ප්‍රධාන ක්‍රියාකාරකම් දක්වා ඇත.

හරිත ලංකා වැඩ සටහනෙහි මෙහෙවර	ප්‍රධාන ක්‍රියාකාරකම්
සැමට පිවිතුරු වාතය	වාහන විමෝචන පරීක්ෂණ වැඩ සටහන යටතේ වාහන විමෝචන පරීක්ෂණ ස්ථාන 57 ක් පරීක්ෂා කරන ලද අතර මාවත් අද්දර වායු විමෝචන පරීක්ෂණ වැඩ සටහන් 24 ක් පැවැත්වීම
ශාක සත්ව හා පරිසර පද්ධති සුරැකීම	දැයට සෙවණ වැඩ සටහන් යටතේ පුල 600,000 ක් රෝපණය කරන ලදී. ජාතික ජෛව විවිධත්ව උපාය මාර්ගික ක්‍රියාත්මක සැලැස්ම පිළියෙළ කිරීමේ මූලික කටයුතු ආරම්භ කර ඇත.
දේශගුණ විපර්යාස මගින් ඇතිවන අභියෝගයන්ට මුහුණදීම	දකුණු පළාත සඳහා දේශගුණික විපර්යාස උපාය මාර්ගය සැකසීම
වෙරළ තීරය හා අවට මුහුද ඥනාන්විත ලෙස පරිහරණය	සමුද්‍ර පරිසරය ආරක්ෂා කිරීම සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම
වගකීමෙන් යුතු ඉඩම් පරිහරණය	ශ්‍රී ලංකාවේ භූමි භායනය පිටු දැකීම සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම
කසලින් තොර වටපිටාවක්	සායනික අපද්‍රව්‍ය පාලනය කිරීම සඳහා දාහකාගාර පහසුකම් ස්ථාපිත කිරීම සනීපාරක්ෂක කසළ රඳවනයක් ඉදි කිරීමේ කටයුතු නිම කිරීම සනීපාරක්ෂක කසළ රඳවන 4ක ඉදි කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී
සැමට සැමදා ජලය	ඛාදනයට පත් කැළණි ගඟෙහි දොම්පෙ සමනබැද්ද ප්‍රදේශයේ ගංගා ඉවුරු පුනරුත්ථාපනය කිරීම
සෞඛ්‍ය හා සමෘද්ධිය උදෙසා හරිත නගර	නාගරික උද්‍යාන 4 ක් ස්ථාපිත කිරීම
කර්මාන්ත හරිතකරණය	හරිත මිලදී ගැනීමේ ප්‍රතිපත්තිය හා මාර්ගෝපදේශ සැකසීම
නිවැරදි තෝරා ගැනීම සඳහා දැනුම	2000 කට වැඩි පිරිසකගේ සහභාගිත්වයෙන් මිහිතල දිනය සමරන ලදී.

2. 2013 වර්ෂයේ පරිසර හා පුනර්ජනනීය බල ශක්ති අමාත්‍යාංශය විසින් ඉටුකරනු ලැබූ ක්‍රියාකාරකම් වල ප්‍රගතිය

හරිත ලංකා වැඩ සටහන සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරිම

පරිසර හා පුනර්ජනනීය බල ශක්ති අමාත්‍යාංශය විසින් "හරිත ලංකා වැඩ සටහන" නමින් නව වැඩසටහනක් ආරම්භ කළ අතර මෙම ක්‍රියාකාරී සැළසුමෙහි මූලික අරමුණ වූයේ ආර්ථික, සමාජීය, සංවර්ධන වැඩ සටහන් වලට බාධා පමුණුවන මෙතෙක් අවධානයට ලක් නොවූ තීරණාත්මක පාරිසරික ගැටළුවලට අදාළව සුදුසු ක්‍රියා මාර්ග ගැනීමයි. හරිත ලංකා වැඩ සටහන යටතේ සකස් කරන ලද ක්‍රියාකාරී සැලසුමෙහි ප්‍රධාන මෙහෙවර / තේමාන්විත ක්ෂේත්‍ර 10 ක් අඩංගු වන අතර ඒවා නම් සැමට පිවිතුරු වාතය, ශාක සත්ව හා පරිසර පද්ධති සුරැකීම, දේශගුණ විපර්යාස අභියෝග ජය ගැනීම, වෙරළ තීරය හා මුහුද ඥානාන්විත ලෙස පරිහරණය කිරීම, වගකීමෙන් යුතුව ඉඩම් පරිහරණය කිරීම, කසළින් තොර වට පිටාවක්, සැමට සැමදා ජලය, සෞඛ්‍යය හා සමෘද්ධිය උදෙසා හරිත නගර, කර්මාන්ත හරිතකරණය සහ නිවැරදි තෝරා ගැනීම සඳහා දැනුම ය. මෙම ක්‍රියාකාරී සැළැස්ම සකස් කිරිමෙහි ලා අදාල අමාත්‍යාංශ, රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික අංශය යන සියල්ලෙහිම සාමූහික දායකත්වයක් සැපයූ අතර මෙහිදී තිරසරභාවය යන්න හුදෙක් සංකල්පයකට පමණක් සීමා නොවී එය යථාර්ථයක් බවට පත් කිරීමෙහි ලා සියළුම සාමාජිකයින් ගෙන් ලැබුණු දායකත්වය අති විශාලය. මෙම ක්‍රියාකාරී සැළැස්ම කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන ඉලක්ක ගණනාවකින් යුතු වන අතර එය 2009 සිට 2016 දක්වා වූ කාලය තුළ ක්‍රියාත්මක වීමට නියමිත අතර මේ සඳහා පරිපූර්ණ වූත්, මැනිය හැකි වූත් ළඟා කර ගත හැකි වූත්, උපාය මාර්ග 82 ක් ද, ක්‍රියාකාරකම් 375 ක් ද ඇතුලත්ය. මෙම වැඩ සටහන අමාත්‍යාංශ 36 ක් හා රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන 70 ක් ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලැබේ. තිරසාර සංවර්ධනය සඳහා වූ සභාවෙහි මංගල සැසිය (NSCD) 2009 ජූලි මස අතිගරු ජනාධිපතිතුමන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වුණි. අමාත්‍යාංශය අනෙකුත් අදාළ පාර්ශවකරුවන් හා එක්ව ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුලත් එක් එක් මෙහෙවර / විෂය පථය යටතේ ප්‍රගතිය වාර්තා කරන කාළසීමාව තුල දී ඉටුකරන ලද ක්‍රියාකාරකම් පහත දක්වා ඇත.

2.1 සැමට පිවිතුරු වාතය

කර්මාන්තශාලා ප්‍රමාණය වර්ධනය වීම, ඉහළ යන මාර්ග තදබදය, තාප විදුලිය ජනනය කිරීම සීඝ්‍රව සිදුවන නාගරීකරණය වැනි දේ මගින් අනෙකුත් ආසියාතික රටවල් වලට මුහුණ පෑමට සිදුවී තිබෙන උග්‍ර වායු දූෂණ ගැටළු වලට ශ්‍රී ලංකාව තවමත් ලක් නොවීම වාසනාවන්ත කරුණකි. වාහන වලින් විමෝචනය වන වායුන් ප්‍රමාණය මුළු විමෝචන ප්‍රමාණයෙන් සියයට 55 – 60 ක් පමණ වන අතර එය ශ්‍රී ලංකාවේ වායු දූෂණය සඳහා ප්‍රධාන දායකත්වය දරයි. ශ්‍රී ලංකාවේ අනෙකුත් වායු දූෂණ කාරක ලෙස කර්මාන්තශාලා වලින් විමෝචනය වන වායු ප්‍රමාණය සියයට 20 – 25 ත් අතර ප්‍රමාණයක් වන අතර ගෘහ ඒකක වලින් එම ප්‍රමාණය සියයට 20 ක් අතර ප්‍රමාණයක් වේ.

ශ්‍රී ලංකාවේ ඉන්ධන භාවිතයෙන් සියයට හැටක් ප්‍රවාහන අංශය සඳහා වැය වේ. ශ්‍රී ලංකාවේ සාපේක්ෂව වායු දූෂණය වැඩි පළාත් ලෙස බස්නාහිර පළාත (කොළඹ, කළුතර හා ගම්පහ දිස්ත්‍රික්ක) කොළඹ මහ නගර සහා බල ප්‍රදේශය හඳුනාගෙන ඇත. මීට අමතරව මහනුවර, ගාල්ල, කුරුණෑගල හා පුත්තලම යන ප්‍රදේශ ද වායු දූෂණය අධික ලෙස සිදුවන ප්‍රදේශ ලෙස හඳුනාගෙන ඇත. 'සැමට පිවිතුරු වාතය' නම් වූ මෙහෙවර ක්‍රියාත්මක කිරීම සඳහා ඉටුකර ඇති මූලික කාර්යයන් පහතින් දක්වා ඇත.

2.1.1 වාහන විමෝචන පර්යේෂණ වැඩසටහන (VET)

කොළඹ හා අනෙකුත් නාගරික ප්‍රදේශවල වායු දූෂණය ඉහළ නංවන ප්‍රධාන ප්‍රභවයක් ලෙස වාහන වලින් පිටවන වායු විමෝචනයන් හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකා රජය විසින් 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත යටතේ විමෝචන පාලන රෙගුලාසි 2003 ජූනි 30 වන දින ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කර ඇත. එම රෙගුලාසි 2008.07.09 දින දරණ ගැසට් අංක 1557/14 මගින් සංශෝධනය කොට ඇත. මෙම රෙගුලාසි මගින් විවිධ වාහන කාණ්ඩ සඳහා උපරිම විමෝචන මට්ටම් සම්බන්ධ ප්‍රමිතීන් සකස් කර ඇත. වාහන වායු විමෝචන වැඩ සටහන රාජ්‍ය හා පෞද්ගලික අංශ වල සහයෝගය ඇතිව සිදුකරන්නක් වන අතර, මේ සඳහා පුද්ගලික අංශයේ මහා පරිමාණ සමාගම් 02 ක් එනම් ක්ලීන්කෝ ලංකා (පුද්ගලික) සමාගම සහ ලාෆ්ස් ඉකෝ ශ්‍රී (පුද්ගලික) සමාගම සහ කටයුතු කරයි. මෙම සමාගම් දෙක මගින් වාහන වායු විමෝචන සහතික පත් නිකුත් කරනු ලබන අතර දැනට පවත්නා වායු රෙගුලාසි යටතේ උතුරු පළාත හැරුණු කොට අනෙකුත් සියලු පළාත් වල ලියාපදිංචි වාහන සඳහා වාර්ෂික ආදායම් බලපත්‍රය ලබාගැනීමට මෙම සහතිකය ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. එනමුත් නවතම වාහන, එම වාහනය ලියාපදිංචි කළ දින සිට අවුරුද්දක කාළසීමාවක් මෙම රෙගුලාසියෙන් නිදහස් කොට ඇත.

- වාහන විමෝචන පරීක්ෂණ වැඩ සටහන යටතේ ස්ථානීය පරීක්ෂණ වැඩ සටහන් 57 ක් පහත දැක්වෙන ස්ථානවලදී සිදු කරන ලදී. එම ස්ථාන නම් අවිස්සාවේල්ල, කරවනැල්ල, රත්නපුර, රඹුක්කන, මාවනැල්ල, කෑගල්ල, අලව්ව, කොස්වත්ත, මාලඹේ, අතුරුගිරිය, මිරිස්වත්ත, ගම්පහ, නිට්ටඹුව, කිරිඇල්ල, පැල්මඩුල්ල, ඇඹිලිපිටිය, නිවිතිගල, බලංගොඩ, ගොඩකවෙල, තලාව, ගලිගමුව, කැඹිතිගොල්ලෑව, හොරොව්පතාන,(උතුරු මැද පලාතේ මධ්‍යස්ථාන 4 ක්) ; (උතුරු පලාතේ මධ්‍යස්ථාන 13 ක් හා ස්ථාන 94 ක්) වව්නියාව, යාපනය, නෙල්ලියාණ්ඩි, චුන්නක්කම්, නල්ලූර්, කිලිනොච්චි, ඔඩ්ඩුසුඩ්ඩාන්, චාවාකච්චේරි, මුලතිව්, මන්නාරම, මාන්කුලම් සහ නාන්අත්තන් ය අදාල වාර්තා පිළියෙළ කර මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුවේ වාහන විමෝචන පරීක්ෂණ ව්‍යාපෘති කාර්යාලය වෙත භාර දෙන ලදී.
- වාහන විමෝචන පරීක්ෂණ වැඩ සටහන යටතේ මාර්ගය දෙපස වායු විමෝචන තත්ව පරීක්ෂා කිරීමේ වැඩ සටහන් 24 ක් ගම්පහ, මොරටුව, කොස්ගම, අනුරාධපුර, තලාව, මාතර, වැල්ලම්පිටිය, වත්තල, දෙනියාය, අකුරැස්ස, නුවර, ගම්පොළ, රාජගිරිය, කඩුවෙළ සිදු කරන ලදී. එහි පසු විපරම් කටයුතු ගම්පහ, මොරටුව පැලියගොඩ, මොරවක, පේරාදෙණිය, රාජගිරිය යන ස්ථාන වලදී සිදු කරන ලද අතර අධික ලෙස දුම් පිටවන වාහන 1691 ක් පරීක්ෂා කරන ලදී. එක් එක් වැඩ සටහන සඳහා සාදන ලද වාර්තා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත වැඩිදුර විමර්ෂණය සඳහා භාර දෙන ලදී.
- අධික ලෙස දුම් පිටවන වාහන නිරීක්ෂණය කිරීමේ වැඩ සටහන් 28 ක් රත්නපුර, ඇඹිලිපිටිය, කුරුණෑගල, බණ්ඩාරවෙළ, සිදුව, වේරහැර දී සිදු කරන ලද අතර පසු විපරම් කිරීමේ වැඩ සටහන් රත්නපුර, ඇඹිලිපිටිය, කුරුණෑගල බණ්ඩාරවෙළ බදුල්ල හා සිදුවේ දී සිදු කරන ලදී.

2.2 ශාක, සත්ව හා පරිසර පද්ධති සුරැකීම

ශ්‍රී ලංකාව ජෛව විවිධත්වයෙන් පොහොසත් රටක් වන අතර ලෝකයේ ජෛව විවිධත්ව උණුසුම් කලාප 34 අතුරින් එකක් ලෙස සැළකේ. ජීවීන්ගේ වාසස්ථාන හානිය හා වාසස්ථාන කැබලිවීම, වන හායනය, ඉඩම් අනවසරයෙන් අත්පත් කර ගැනීම, ප්‍රමාණය ඉක්මවා කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතය, දේශගුණ විපර්යාස වල බලපෑම් වැනි සෘජු හා වක්‍ර සාධක වල බලපෑම් මත වර්තමානයේ ජෛව විවිධත්වය සීඝ්‍ර ලෙස හායනය වන බව පැහැදිලිව හඳුනා ගෙන ඇත.

මෙම ජෛව විවිධත්ව හායනයේ බරපතලකම හා වැදගත්කම හඳුනාගෙන තර්ජනයට ලක් වූ සත්ව හා ශාක විශේෂ වල ස්ථානීයව හා පරිබාහිරව සංරක්ෂණය කරනු සඳහා අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය විසින් ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්ව සංරක්ෂණය ක්‍රියාවට නැංවීම සඳහා කාර්ය රාමුව සකස් කිරීම ශ්‍රී ලංකාවේ තර්ජනයට ලක් වූ සත්ව හා ශාක විශේෂයන්ගේ රතු දත්ත ලැයිස්තුව යාවත්කාලීන කිරීම මගින් පියවර ගෙන ඇත. ශ්‍රී ලංකාවේ තර්ජනයට ලක් වූ සත්ව හා ශාක විශේෂයන්ගේ රතු දත්ත ලැයිස්තුව අවස්ථානුකූලව යාවත්කාලීන කරන අතර එහි නවතම යාවත්කාලීන කිරීම 2011 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. මෙම රතු දත්ත ලැයිස්තුව 2007 වර්ෂයේ දී යාවත්කාලීන කරන ලද අවස්ථාවේ දී ශ්‍රී ලංකාවේ ඇති ශාක විශේෂ අතුරින් 1/3 ක් පමණක් ඇගයීමට හා තක්සේරුකරණයට ලක් කිරීම සිදු කරන ලද අතර 2011 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන සියළුම ශාක විශේෂයන් හි වර්තමාන තත්වය වඩාත් හොඳින් සංරක්ෂණය කිරීම සඳහා ඇගයීමට හා තක්සේරුකරණයට ලක් කෙරිණි. ඉහළ ජෛව විවිධත්වය ජෛව ප්‍රක්ෂේපණ ක්‍රියාවලිය සඳහා විශාල දායකත්වයක් සපයයි. එහෙයින් අභ්‍යන්තර හා බාහිර පුද්ගලයින් හා ආයතන රටේ ජෛව සම්පත් අයුතු ලෙස හා නීති විරෝධී ලෙස උකහා ගනී. මෙම කරුණු හඳුනාගත් ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය ජාන සම්පත් සඳහා ප්‍රවේශ වීම හා රටේ ජෛව සම්පත් වගකීමෙන් යුතුව භාවිතා කිරීමේ අරමුණින් ප්‍රතිලාභ භුක්ති විඳීම පිළිබඳව අදාල නීති සකස් කරමින් පවතී.

ලංකාවේ ස්වභාවික පරිසර පද්ධති සංරක්ෂණය කිරීමෙහි ලා වගකීමෙන් යුතු ප්‍රධාන රාජ්‍ය ආයතන දෙකක් වන වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම සඳහා දැනටමත් යම් යම් ක්‍රියාමාර්ග ගෙන ඇති අතර එය ඉදිරි දශක වලටත් අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ඇත. දිවයින පුරා පැතිර ඇති රක්ෂිත ප්‍රදේශ ජාලය පිළිබඳව විද්‍යාත්මක හිදැස් විශ්ලේෂණයක් සිදු කොට ජෛව විවිධත්වය සඳහා වැදගත් වන ප්‍රදේශ ලංකාවේ විධිමත් රක්ෂිත ප්‍රදේශ ජාලයට ඇතුලත් කිරීමට පියවර ගෙන ඇත.

මෙම ක්‍රියාවලිය අදාල බිම් ප්‍රමාණය නීතිමය රැකවරණය සහිතව වැඩි කර ගැනීමටත් සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථයන් හි 7 වන අභිමතාර්ථය මුදුන් පමුණුවා ගැනීමටත් දායකවිය. පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා එක්ව ක්‍රමවත් හා විද්‍යාත්මක ප්‍රවේශයක් තුලින් අවිචාරවත් ලෙස වන හරණය කළ වැදගත් සත්ව හා ශාක වලින් යුත් බිම් කඩවල් ජෛව විවිධත්වයෙන් අනූන ප්‍රදේශ ලෙස ප්‍රකාශ කිරීමට කටයුතු කෙරෙමින් පවතී.

2.2.1. හරිත ගම්මාන වැඩ සටහන

තෝරා ගන්නා ලද ආදර්ශ ගම්මාන සඳහා ආර්ථික වශයෙන් වාසිදායක දිගුකාලීන, පාරිසරික හිතකාමී පාඨමාලා හඳුන්වා දෙමින් ග්‍රාමීය සංවර්ධනය හරහා ජාතික සංවර්ධනය සඳහා දායකවීම හරිත ගම්මාන වැඩ සටහනේ මූලික අරමුණ වේ.

- රක්ෂිත ප්‍රදේශ ජාලයෙන් පිටත ශාක හා සත්ත්ව සංරක්ෂණය හා තිරසර භාවිතය
- ආදර්ශ හරිත ගම්මාන 8 ක් ස්ථාපනය කිරීම - මතුගම, අගලවත්ත, දොම්පෙ, කුලියාපිටිය නැගෙනහිර, පොල්පිතිගම, දොළුව, හඟුරන්කෙත සහ කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ආදර්ශ හරිත ගම්මාන 8 ක් ස්ථාපනය කරන ලදී
- ඔසු උයන් 20 ක් සහ පළතුරු උයන් 10 ක් ස්ථාපනය කිරීම - පාසල් සහ පන්සල් වතු ආශ්‍රිතව ඔසු උයන් 20 ක් සහ පළතුරු උයන් 10 ක් ස්ථාපනය කරන ලදී

2.2.2 "දැයට සෙවණ" රුක් රෝපණ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ 65 වන ජන්ම දිනය හා දෙවන පදවි ප්‍රාප්තිය නිමිත්තෙන් "දැයට සෙවණ" ජාතික රුක් රෝපණ වැඩ සටහන 2010 නොවැම්බර් මස 15 වන දින පැළ එකොළොස් ලක්ෂයක් දිවයින පුරා රෝපණය කරමින් උත්සවාකාරයෙන් ආරම්භ කරන ලදී. 2010 වසරෙහි දී ආරම්භ කරන ලද "දැයට සෙවණ" රුක් රෝපණ වැඩ සටහනේ සාර්ථකත්වය මත වන ආවරණය වැඩි කර ගැනීමේ අරමුණින් "මහින්ද චින්තන" ඉදිරි දැක්මෙහි දක්වා ඇති පරිදි මෙම වැඩ සටහන වාර්ෂිකව පැවැත්වීම සඳහා කැබිනට් අමාත්‍යවරුන් විසින් අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව "දැයට සෙවණ" රුක් රෝපණ වැඩ සටහන2011 හා 2012 වර්ෂ වලදී ද අඛණ්ඩව ක්‍රියාත්මක කෙරුණ අතර 2012 වසරේ දී ද පෙර වසර වල මෙන් පැල එකොළොස් ලක්ෂය බැගින් සාර්ථකව රෝපණ කිරීමට හැකිවිය.

පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් 2010 නොවැම්බර් මස 15 දින විනාඩි 15 ක් තුල දීප ව්‍යාප්තව පැළ එකොළොස් ලක්ෂයක් (1,100,000) රෝපණය කරමින් "දැයට සෙවණ" ජාතික රුක් රෝපණ වැඩ සටහන ආරම්භ කරන ලදී. එදින සිට සෑම වසරකම "දැයට සෙවණ" ජාතික රුක් රෝපණ වැඩ සටහන ක්‍රියාත්මක කළ යුතු බව 2011.09.14 වන දින රැස්වූ අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර ඇත.

"නිල්ල පිරුණු රටක්" අපේ සංවර්ධනයේ අඩිතාලම ලෙස මහින්ද චින්තන ඉදිරි දැක්ම අළුත් ශ්‍රී ලංකාවක් සඳහා වූ වැඩ පිළිවෙළ අවධාරණය කෙරේ. පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය නිරතුරුවම හා අඛණ්ඩවම හරිත ශ්‍රී ලංකාවක් සඳහා නව වන වැස්මක් ඇති කිරීමටත්, පවතින වන වැස්ම ආරක්ෂා කිරීමටත් ක්‍රියාත්මක වේ.

"දැයට සෙවණ" රුක් රෝපණ වැඩ සටහනේ ප්‍රධාන අරමුණු

i. දිවයිනේ ස්වභාවික වනාන්තර වලින් පිටත තුරු ආවරණය වැඩි දියුණු කිරීම
ii. රුක් රෝපණය කිරීමේ වැදගත්කම පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම
iii. රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමඟ රුක් රෝපණ කටයුතු ප්‍රවර්ධනය කිරීම

- විශේෂයෙන්ම මිහිතලයේ මානව පැවැත්ම සඳහා වඩාත්ම අහිතකර බලපෑම වන මිහිතලය උණුසුම්වීම සමනය සඳහා රුක්රෝපණය ඉතා වැදගත්වේ.
- එමගින් දේශගුණ විපර්යාස අවම කිරීම,පාශු සංරක්ෂණ සඳහා දායක වීම,ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම වැනි ගෝලීය අවශ්‍යතා සඳහා දායකත්වයක් ලබාදිය හැක.(RIO CONVENTIONS)
- ජල මූලාශ්‍ර සංරක්ෂණය සඳහා දායක වීම.

- ආහාර නිෂ්පාදනය වර්ධනය සඳහා දායක වීම.
- දැව නිෂ්පාදනය සඳහා දායක වීම.
- වෙනත්

තේමාව - "නිල්ල පිරුණු රටක් - පැහැබර අනාගතයක්"

1. **දිස්ත්‍රික් රුක් රෝපණ වැඩසටහන**
   - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් තෝරාගත් එක් ස්ථානයක හෝ දෙකක රුක් රෝපණය කිරීම සඳහා තෝරා ගැනේ.මේ සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් නිශ්චිත ස්ථාන තෝරා ගැනේ.එනම් ජල පෝෂක ප්‍රදේශ, රක්ෂිත,හායනයට ලක් වූ කඳු මුදුන්, පොදු ස්ථාන ආවරණය කරමින් ක්‍රියාත්මක විය.
     මෙම වැඩසටහන සම්බන්ධීකරණය සඳහා අමාත්‍යාංශ මට්ටමෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිළධාරීන් පත් කරන ලදී.
   - දිසාපති/ දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් හා දිසා වන නිළධාරීගේ සම්බන්ධීකරණය තුලින් තෝරාගත් ස්ථාන වල පැළ රෝපණය කරන ලදී.
2. **ත්‍රිවිධ හමුදාව, පොලීසිය හා බන්ධනාගාරය සමග සිදු කෙරෙන/රුක් රෝපණ වැඩසටහන**
   - මෙම වසරේදී ද එම ත්‍රිවිධ හමුදාව සම්බන්ධිකරණයෙන් උතුරු නැගෙනහිර ප්‍රදේශ ද ආවරණය කරමින් දීප ව්‍යාප්තව පැළ රෝපණය කරන ලදී.
   - පොලීසිය හා බන්ධනාගාරය පැළ 50,000ක් පමණ පැළ ප්‍රමාණක් රෝපණය කරන ලදී.
3. **අනුග්‍රාහක පදනම මත සිදු කෙරෙන රුක් රෝපණ වැඩසටහන**
   - මෙම වැඩසටහන හා සමගාමීව හයිඩ්‍රාමණී පෞද්ගලික ආයතනය විසින් කුරුවිට විජයකුමාරතුංග විද්‍යාලය හා අගලවත්ත යටියන කනිෂ්ඨ විද්‍යාලය සම්බන්ධ කරගනිමින් පාසැල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.
4. **මහවැලි ජල පෝෂක ප්‍රදේශ වල කෙරෙන රුක් රෝපණ වැඩසටහන**
   - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සම්බන්ධීකරණය මගින් තෝරාගත් මහවැලි ජල පෝෂක ප්‍රදේශ වල රුක් රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී .
5. **මහා මාර්ග දෙපස ක්‍රියාත්මක කෙරෙන රුක් රෝපණ වැඩසටහන**
   - දැයට සෙවණ ලේකම් කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය, වරාය හා මාර්ග සංවර්ධන අධිකාරිය එක්ව දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි මාර්ග දෙපස පැළ රෝපණය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. මේ යටතේ රෝපණය කෙරුනු පැළ ප්‍රමාණය 83000 ක් පමණ වේ.
6. **රජයේ ආයතන සමග කෙරෙන රුක් රෝපණ වැඩසටහන**
   - කිතුලු සංවර්ධන අධිකාරිය (මහනුවර ,බදුල්ල,කෑගල්ල ,රත්නපුර)නොවැම්බර් දිනට 15ජාතික රුක් රෝපණ වැඩසටහන සමගාමීව රෝපණය කරන ලදී .
   - සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය,කජු සංස්ථාව, ආයුර්වේද දෙපාර්තමේන්තුව සහ කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් රුක් රෝපණය කරන ලදී.
7. **පාසැල් සිසුන් හරහා ක්‍රියාත්මක කෙරෙන රුක් රෝපණ වැඩසටහන**
   - පාසැල් සිසුන් හරහා තම පාසැල තුල ස්වේච්ඡාවෙන් පැළ සිටුවීම සිදු කෙරුණි.

8. **ආක්‍රමණශීලී ශාක ඉවත් කර එම ප්‍රදේශ වල ක්‍රියාත්මක කෙරෙන රුක් රෝපණ වැඩසටහන**
   - ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය මගින් මාඳු ගඟේ ව්‍යාප්තව පවතින කටු පෙඳ නැමති ආගන්තුක ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම මෙම වැඩසටහන හා සමගාමීව සිදු විය .
9. **කඩොලාන ශාක වගා කිරීමේ ව්‍යාපෘතිය**
   - සමුද්‍රිය පරිසර ආරක්ෂණ අධිකාරිය මගින් මීගමුව, හලාවත, ගාල්ල යන ස්ථාන වල තෝරාගත් ස්ථාන වල කඩොලාන ශාක සිටුවීම.
   - ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය මගින් වන සංරක්ෂන දෙපාර්තමේන්තුවේ අධික්ෂණය යටතේ මන්නාරම, මඩකළපුව, මුලතිව් යන දිස්ත්‍රික්ක වල කඩොළාන ශාක සිටු විම.
10. **ඛණිජ මැණික් හා අනෙකුත් ඛණිජ ඉවත් කරන ලද ස්ථාන වල ක්‍රියාත්මක කෙරෙන රුක් රෝපණ වැඩසටහන**
   - **භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය පොළොන්නරුව -** මහවැලි ගඟේ මනම්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දකුණු ඉවුරේ බාදනයට ලක් වූ ස්ථාන තෝරාගෙන රුක් රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී .
   - **ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය-** කතරගම තම්මැන්නාව මැණික් කැණීම් සඳහා වෙන්දේසි කරන ලද භූමි තෝරාගෙන මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරුණි.
11. **පාසැල් ළමුන් සඳහා චිත්‍ර තරඟයක් පැවැත්වීම**
   - " රකින්නට අපේ ලෝකය එක පැළයක් හෝ සිටුවමු" යන තේමාව යටතේ කනිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ, ද්විතීය හා ජ්‍යෙෂ්ඨ යන අංශවලින් චිත්‍ර තරඟයක් පවත්වන ලදී. මේ සඳහා දිවයිනේ සියළුම පාසැල් නියෝජනය කරමින් චිත්‍ර 5000 ක් පමණ ලැබී ඇත.
   - ඒ අනුව කාණ්ඩ 4 (කනිෂ්ඨ,ජ්‍යෙෂ්ඨ, ජ්‍යෙෂ්ඨ ද්විතීක හා විශේෂ අවස්ථා ඇති දරුවන්ගේ අංශය) ඔස්සේ ජයග්‍රාහිකයින් තෝරා ගන්නා ලදී.

2.2.3 ජෛව විවිධත්ව ක්‍රියාකාරකම් ආශ්‍රිත ප්‍රතිපත්ති

ජෛව විවිධත්ව කාර්යාංශය මගින් ජාන සම්පත් වෙත ප්‍රවේශය සහ ප්‍රතිලාභ සමසේ බෙදා ගැනීම සහ පාරම්පරික දැනුම පිළිබඳ ජාතික ප්‍රවීනතා කමිටු රැස්වීම පවත්වන ලදී.

පාරම්පරික දැනුම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කොට අවසන් අතර එය අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා සූදානම් කොට පවතී.

ජාන සම්පත් වෙත ප්‍රවේශය සහ ප්‍රතිලාභ සමසේ බෙදාහැරීම හා සම්බන්ධ ජෛව සම්පත් වෙත ප්‍රවේශ, තිරසාර භාවිතය හා ප්‍රතිලාභ බෙදීයාම, යාමනය සම්බන්ධ කටයුතු පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ජෛව විවිධත්ව කාර්යාලය මගින් අවසන් කරමින් පවතී.

2.2.4 ස්ථානීය සංරක්ෂණය

පාසල් ළමුන් සඳහා සංරක්ෂණ දැනුවත් කිරීමේ වැඩ සටහන් 2 ක් ද පොදු ජනතාව සඳහා පුරා ජෛව විවිධත්වය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහනක් ද පවත්වන ලදී

සංචාරක කර්මාන්තයේ මාර්ගෝපදේශකවරුන් සඳහා පුරා ජෛව ගුහා සංචරණය පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී. ක්ෂේත්‍ර චාරිකාව බටදොඹලෙන දී පවත්වන ලද අතර ගුහා සංචරණ කර්මාන්තය තිරසාර ලෙස පවත්වාගෙන යාම සඳහා සංචාරක මාර්ගෝපදේශයන් දිරි ගැන්වීම එහි අරමුණ විය.

අරුවක්කාලු ප්‍රදේශයේ පවතින ඒවා මයෝසීන සත්ව කොටස් හඳුනා ගැනීම සඳහා පර්යේෂණ පවත්වන ලදී. තවද අරුවක්කාලු මයොසීන කොරියෙහි සංරක්ෂණ සහ පර්යේෂණ කටයුතු සඳහා වෙන් කරන ලද ප්‍රදේශය සඳහා මිණුම් සිතියම් සකස් කරන ලදී. ලබන වසර තුල මෙම ප්‍රදේශය පුරා විද්‍යා පනත යටතේ ආරක්ෂිත ප්‍රදේශයක් ලෙස ගැසට් කිරීමට බලාපොරොත්තු වේ.

පාසල් ළමුන්, පොදු ජනතාව වැනි සියළුම මට්ටම් සඳහා ඵලදායී සංරක්ෂණ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළවල් පවත්වන ලද අතර පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ජෛව විවධත්ව ලේකම් කාර්යාලය මගින් 2012 වර්ෂය සඳහා ජාතික රතු දත්ත ලැයිස්තුව එළිදක්වන ලදී. තවද, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය හා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයන් හි ශිෂ්‍යයින් සහ අධ්‍යයන සේවක මණ්ඩලය සඳහා රජයේ නිලධාරින් සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් එම ආයතනය මගින් පවත්වන ලදී. ජාතික රතු දත්ත ලැයිස්තුවේ අන්තරායට ලක් වූ ආවේණික මත්ස්‍ය හා සමනළ විශේෂ පිළිබඳ අන්තර් ජාතික රතු දත්ත වාර්තාව යාවත්කාලීන කිරීම සඳහා වැඩමුළුවක් පවත්වන ලදී. රතු දත්ත වාර්තාවේ සාකච්ඡා කරන ලද තොරතුරු ප්‍රචාරණය කිරීම සඳහා දත්ත හුවමාරු කර ගැනීමේ වැඩමුළුවක් ද පවත්වන ලදී.

2.2.5 ජෛව විවිධත්ව පර්යේෂණ / සමීක්ෂණ

පරාග වාහකයන් සංරක්ෂණය යටතේ ජෛව පරාගනය සහ පරාගනය වන විශේෂ පිළිබඳව ක්ෂේත්‍ර පර්යේෂණ අධ්‍යයන කටයුතු සඳහා පහසුකම් සළසා දෙන ලදී.

සවානා පරිසර පද්ධති සඳහා ජෛව විවිධත්ව සමීක්ෂණයක් පවත්වන ලදී. විශේෂයෙන්ම මෙම අද්විතීය පරිසර පද්ධතියට මෙන්ම ගිනි තැබීම් වලට අනුවර්තනය වූ බොහෝ විශේෂ පිළිබඳව තොරතුරු මෙම සමීක්ෂණය මගින් අනාවරණය කර ගන්නා ලදී.

දඹදෙණිය ප්‍රදේශයේ සමීක්ෂණයක් සිදු කරන ලද අතර ඊට අමතරව සංචාරකයින් සඳහා ඓතිහාසික උරුමයන්ගෙන් බැහැරව ජෛව විවිධත්වය පිළිබඳවද දැනුවත් කිරීම් සිදු කරන ලදී.

ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පලාත් හි පවතින තොරතුරු අඩුබව හේතුවෙන් එහි *Acavus* විශේෂ, දිවි මකුළුවන්, මිරිදය කකුළුවන් සහ සමනලයින් පිළිබඳ පර්යේෂණ වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී. මේවා මගින් ලබා ගන්නා තොරතුරු ජාතික රතු දත්ත වාර්තාව යාවත්කාලීන කිරීම සහ ජෛව විවිධත්ව සංරක්ෂණ සහ කළමනාකරණ සැළසුම් සකස් කිරීම සඳහා උපයෝගි කර ගනී.

2.2.6 ජෛව විවිධත්ව දැනුවත් කිරීම්

- ජාතික උද්භිද උද්‍යානය ද , පේරාදෙණිය සහ කොළඹ විශ්ව විද්‍යාලයන්හි සහයෝගිත්වයෙන් පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව කාර්යාලය මගින් ශාක අනුක පද්ධතිය පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී. ශාක විද්‍යාඥයින් සහ ශාක හඳුනා ගැනීම පිළිබඳ අනුක විද්‍යාවේ නව දියුණුව හා

සම්බන්ධ වර්ගීකරණයන් පිළිබඳ දැනුවත්කම ඉහළ නැංවීම මෙම වැඩමුළුවේ ප්‍රධාන අරමුණ විය. මෙම නව තාක්ෂණය මගින් ඔවුන්ගේ කාර්යයන් වඩා ඵලදායී ලෙස කරගත හැකි අතරම ශ්‍රී ලංකා රේගුව, ශාක නිරෝධායන ඒකකය, රාජ්‍ය ආයතන සහ දැනුම වපුරවා හරින ශාස්ත්‍රධාරීන් මෙම වැඩ සටහන සඳහා ඉලක්ක කර ගන්නා ලදී. ක්ෂේත්‍ර සහ විද්‍යාගර දේශන සඳහා සම්පත් දායකයින් ලෙස ඕස්ට්‍රේලියාවේ, වියානා විශ්ව විද්‍යාලයෙහි ආචාර්ය මිචෙල් බාර්ෆියුස් සහ බ්‍රිතාන්‍යයේ කිව් රාජකීය උද්භිද උද්‍යානය, ජොඩ්රෙල් විද්‍යාගාරයේ අධ්‍යක්ෂ මහාචාර්ය මාර්ක් ඩබ් චේස් යන මහත්වරුන් සහභාගි වන ලදී.

- ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මගින් ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේද සහයෝගිත්වයෙන් පස් රහිතව ශාක වගා කිරීම පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී. මෙහිදී පස් රහිතව ශාක වගා කිරීම පිළිබඳ භාවිතයන් ද තට්ටු නිවාස, නිවාස සංකීර්ණ, නාගරික නිවාස වැනි අඩු ඉඩ පහසුකම් සහිත ප්‍රදේශවල ශාක විවිධත්වය වැඩි කර ගන්නේ කෙසේද යන්න පිළිබඳව වඩා හොඳින් අවබෝධ කර ගැනීමට ආදර්ශයන් ගෙන හැර දක්වන ලදී.

- ජෛව විවිධත්වය හා ආශ්‍රිත ජාත්‍යන්තර ලේඛණ සහ ජෛව විවිධත්ව සංරක්ෂණය පිළිබඳ දැනුම ඉහළ දැමීම සඳහා වනය ආරක්ෂා කරන, වනය තුලම ජීවත් වන ආරක්ෂක නිලධාරි මහත්ම මහත්මීන්ට වන විද්‍යායතනයෙහි දී කඳුකර ජෛව විවිධත්ව සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන පවත්වන ලදී.

- 11 වන ජාත්‍යන්තර කඳුකර දිනය 2013 දෙසැම්බර් මස 17 වන දින ජෛව විවධත්ව ලේකම් කාර්යාලයේ ප්‍රධානත්වයෙන් නුවරඑළිය හෝර්ටන්තැන්න ජාතික වනෝද්‍යානයේ සමරන ලදී. මෙම වැඩ සටහන මගින් ජීවීන්ට ජීවත්වීම සඳහා කඳුකර පරිසරය ඉතා වැදගත් බව පෙන්වා දෙන ලදී. එමෙන්ම කඳුකර පරිසර පද්ධතියේ සංරක්ෂණ කටයුතු සඳහා පවතින අවස්ථා මෙන්ම බාධක ද ලෝකයේ කඳුකර ප්‍රදේශ සංරක්ෂණය සඳහා ධනාත්මක වෙනසක් ගොඩනැගීම ද සිදු කරන ලදී. මෙහි දී ප්‍රධාන ලෙසම තේ වැවිලිකරුවන් ඉලක්ක කර ගන්නා ලද අතර වැවිලි අංශයේ 70 දෙනෙකු ද වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, තේ පර්යේෂණ ආයතනය, ජෛව විවිධත්ව සංරක්ෂණ සංගමය සහ පරිසර සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ නිලධාරින් ද මෙම වැඩ සටහන සඳහා සහභාගි වන ලදී.

- කඩොලාන පරිසරය පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩමුළු 2 ක් පවත්වන ලදී. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා එක්ව කඩොලාන පරිසර පද්ධතියේ හෙක්ටයාර 24 ක ප්‍රමාණයක් ප්‍රතිස්ථාපනය කරන ලදී. එහි දී කඩොලාන ශාක 30,000 කට අධික ප්‍රමාණයක් මන්නාරම, මුලතිව් හා මඩකලපුව යන දිස්ත්‍රික්ක වල රෝපණය කරන ලදී.

- පරිසර සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පාංශු ජෛව විවිධත්වය පිළිබඳ ප්‍රථම සමුළුව ශ්‍රී ලංකා සංවර්ධන හා පරිපාලන ආයතනයෙහි දී 2013 දෙසැම්බර් 10 සහ 11 යන දෙදින පවත්වන ලදී. ඒ සඳහා ආරාධිත අමුත්තන්, රාජ්‍ය නිලධාරින්, අධ්‍යාපන අංශයේ විවිධ නිලධාරින්, පර්යේෂකයින්, පෞද්ගලික ආයතනවල නිලධාරින්, විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් මෙන්ම පරිසර සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ නිලධාරින් ද සහභාගි වන ලදී. ප්‍රධාන තේමා 5ක් යටතේ වෙනවෙනම මෙම සමුළුව පවත්වන ලද අතර ඒ සඳහා සහභාගි වූ ප්‍රවීනයන් විසින් සියළු කොටස් අධ්‍යයනය කරන ලද අතර කණ්ඩායම් සාකච්ඡාවක් ද පවත්වන ලදී.

මෙහි ප්‍රධාන අරමුණ වූයේ පාංශු ජෛව විවිධත්වය තිරසාර භාවිතය හා සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම සහ දැනුම බෙදා හැරීමයි. මෙහි අවසන් ප්‍රතිඵලය ලෙස පාංශු ක්ෂුද්‍ර ජීවී විවිධත්වය සංරක්ෂණය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් ඇති කිරීමත් මෙම ක්ෂේත්‍රයන් හි පවතින පර්යේෂණ දත්ත ක්‍රමවත් ලෙස එක් කිරීමත් සිදු විය.

- ''ජලය සහ ජෛව විවිධත්වය'' යන තේමාව යටතේ පරිසර සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජාත්‍යන්තර ජෛව විවිධත්ව දිනය 2013 මැයි 22 වන දින ''සවිසිරිපායේ'' දී සමරන ලදී.

- ශ්‍රී ලංකාවේ විද්‍යා දැනුම බෙදා හැරීම යටතේ මේ සඳහා කථික තරඟයක් පවත්වන ලද අතර ඒ සඳහා රාජකීය විද්‍යාලය, තර්ස්ටන් විද්‍යාලය, ක්ලිප්ටන් බාලිකා විද්‍යාලය සහ ආනන්ද බාලිකා විද්‍යාලයේ සිසු සිසුවියන් සහභාගි වන ලදී.

2.2.7 කෘෂි ජෛව විවිධත්වය

ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්ව මිල කිරීම ව්‍යාපෘතියේ එක් කොටසක් ලෙස 2013 සැප්තැම්බර් 26 – 27 දෙදින මානව ජීවිකාව, ජෛව විවිධත්වය සහ පරිසර පද්ධති සේවාව පිළිබඳ ජාතික සමුළුවක් පවත්වන ලදී. මෙය මෙරට මෙන්ම විදේශ රටවල ද පර්යේෂකයන්ගේ පර්යේෂණ සොයා ගැනීම් බෙදා හදා ගැනීමට ඉතාමත් වැදගත් අවස්ථාවක් විය.

ශ්‍රී ලංකාවේ පවතින ජෛව විවිධත්වය හා පරිසර පද්ධති ඒවායේ තිරසාර භාවිතය හා සංරක්ෂණය තහවුරු කර ගනිමින් ජාතික ආර්ථිකය සඳහා දායක වීමට අවශ්‍ය වේ. ජාතික ආර්ථිකයේ පුද්ගලික - රාජ්‍ය සබඳතාවය පවත්වා ගැනීමේ අලෙවිකරණ මෙවලම් ලෙස පරිසර පද්ධති සඳහා ගෙවීම් කිරීම හඳුන්වා දී ඇත.

ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කළාප සංරක්ෂණය සහ දේශගුණික විපර්යාස වලට ජනයා අනුගතවීම ව්‍යාපෘතියේ මූලිකත්වයෙන් ආචාර්ය ටෝබි හොඩ්කින්ග්, ආචාර්ය බ්‍රුවොන්ස්ටැපිට් දෙව්රා ජාවිස් සහ ඇම්බියා තාපු මහත්මිය වැනි ජාත්‍යන්තර ප්‍රවීනයන්ගේ සහභාගිත්වයෙන් මූලික ස්ථාන 3 ක ගොවීන් සඳහා පුහුණු වැඩමුළුවක් ජෛව විවිධත්ව කාර්යාලය මගින් සංවිධානය කරන ලදී.

ඉහත ව්‍යාපෘතියේ ජාතික ප්‍රවීනතා රැස්වීම 2013.02.03 වන දින ව්‍යාපෘතියේ පාර්ශ්වකරුවන්, ආචාර්ය ෂක්ලින් මරීටා, ආචාර්ය දෙව්රා ජාවිස් වැනි ජාත්‍යන්තර ප්‍රවීනයන් සහ අමාත්‍යාංශය අතර පවත්වන ලදී.

මානව පෝෂණය හා යහ පැවැත්ම වැඩි දියුණු කිරීම සඳහා ජෛව විවිධත්වය හා තිරසාර භාවිතය අනුප්‍රවාහගත කිරීමේ ව්‍යපෘතියට අදාල ජාතික වැඩමුළුවක් ගල්කිස්ස බර්ජියා හෝටලයේ දී 2013 ජූනි මස දී දින 2 ක් පුරා පැවැත්විණි. තවද, මෙම ව්‍යාපෘතියට අදාල මූලික සමීක්ෂණ මූලික ස්ථාන 3 ක දී සිදු කරන ලදී. ඒවා නම් උඩුදුම්බර, අඹතැන්න සහ ගම්පොළ වේ. මෙහිදී පෝෂණ ගුණයෙන් යුතු සාම්ප්‍රදායික බෝග වර්ග හඳුනා ගන්නා ලදී.

2.3 දේශගුණ විපර්යාස අභියෝග ජය ගැනීම

වසර දෙසියයකට වැඩි කාලයක් ගල් අඟුරු සහ ඛණිජ තෙල් වැනි පොසිල ඉන්ධන දහනය හා වනාන්තර එළි කිරීම නිසා ''හරිතාගාර වායු'' වායු ගෝලයේ කැපී පෙනෙන ලෙස ඉහළ යෑමට හේතු වීය.

හරිතාගාර වායු ජීවය පවත්වාගෙන යාමට අත්‍යවශ්‍ය වේ. මන්දයත් එකී වායු මගින් පෘථිවි පෘෂ්ඨය උණුසුම්ව තබා ගැනීමට උපකාරී වීමයි. නමුත් වායු ගෝලයේ මෙම වායුන් හි සාන්ද්‍රනය ඉහළ යමින් පැවතීම නිසා පෘථිවියේ උෂ්ණත්වය පසුගිය කාලයේ පැවති තත්වයට වඩා අඛණ්ඩ වැඩිවීමක් දක්නට ලැබේ. මෑත දශකවල පෘථිවියේ උෂ්ණත්වය ඉහළ යාමට බොහෝ සෙයින් බලපා ඇත්තේ මිනිස් ක්‍රියාකාරකම් වල ප්‍රතිපලයන්ය.

මුහුදු ජල මට්ටම ඉහළ යාම, ඉහළ උෂ්නත්වයන්, නිතර නිතර හා දීර්ඝ කාලීනව පවතින නියඟය, ඉහළ තීව්‍රතාවයක් සහිත වර්ෂාපතනය හා ඉහළ අකුණු සැර ක්‍රියාකාරිත්වයට පෘථිවිය උණුසුම් වීම ආදිය ගෝලීය උණුසුම් වීමේ ප්‍රතිඵලයන්ය. මෙලෙස ඇතිවන දේශගුණික විපර්යාස හේතුවෙන් වෙරළබඩ ප්‍රදේශ වලට, ජාතික ආර්ථිකයේ විවිධ ක්ෂේත්‍රවලට හා මානව සෞඛ්‍යයට සැළකිය යුතු ලෙස බලපෑම් ඇති කරයි.

සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස හා දිවයිනක් ලෙස ශ්‍රී ලංකාව විශේෂයෙන් මෙම බලපෑම් වලට පහසුවෙන් පාත්‍ර වේ. දේශගුණ විපර්යාස ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් වලට, ආර්ථික ක්‍රියාවලීන්ට හා මිනිසුන්ගේ යහ පැවැත්මට විශාල ලෙස බලපෑම් ඇති කරයි. දේශගුණ විපර්යාස ශ්‍රී ලංකාව කෙරෙහි දක්වන බලපෑම මුළුමනින්ම අධ්‍යයනය කර ඇති අතර පසුගිය වසර 20 තුල මෙරට ආදායම් ඉහල දැමීම හා දුප්පත්කම අවම කිරීම තුලින් අත්කර ගත් කැපී පෙනෙන ජයග්‍රහන වලට එම බලපෑම් තර්ජනයක් එල්ල කරයි. දැනට සිදු කරන ලද මූලික පර්යේෂණ හා ප්‍රක්ෂේපන මගින් ශ්‍රී ලංකාව විශාල වශයෙන් හා විවිධාකාර ඉහළ අවධානම් තත්ව වලට හා බලපෑම් වලට පාත්‍ර වන බව පෙනී යයි.

පරිසර අමාත්‍යාංශයේ දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය මෙරට ආර්ථික සංවර්ධන ක්ෂේත්‍රයට දේශගුණ විපර්යාස වලින් සිදු වන අභියෝග වලට මුහුණදීම සඳහා විවිධ ක්‍රියා මාර්ග ගෙන ඇත. දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය පිහිටුවීමේ මූලික අරමුණ වනුයේ දේශගුණ විපර්යාස හා බැඳුනු පර්යේෂණ හා පර්යේෂණ ප්‍රතිඵල බෙදා හැරීම තුලින් ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් නැවත ප්‍රතිසංස්කරණය ප්‍රේරණය කිරීමයි. දේශගුණ විපර්යාස අභියෝග ජය ගැනීම නම් වූ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ඉටු කර ඇති ප්‍රධාන ක්‍රියාකාරකම් පහත දක්වා ඇත.

2.3.1 ශ්‍රී ලංකාවේ පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රනය සඳහා වූ ජාතික බලාත්මක අධිකාරිය ලෙස නව පවිත්‍ර සංවර්ධන ව්‍යාපෘති ඇගයීම හා අනුමත කිරීම (DNA)

එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිලිබඳ වූ රාමුගත සම්මුතියේ විධායක කමිටුවෙහි අරමුණු ඉටු කිරීම සඳහා 1997 ජපානයේ කියෝතෝ හිදී එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිලිබඳ වූ රාමුගත සම්මුතියේ විධායක කමිටුවෙහි සාමාජිකයන් සමග පැවැත්වූ තුන් වන සමුළුවේදී නීතියෙන් බැඳී ඇති ගිවිසුමක් ඇති කරගන්න ලදී. කියෝතෝ සම්මුතිය යටතේ, කාර්මික රටවල් 2008 - 2012 කාලය අතරතුර ඔවුන්ගේ මිශ්‍ර හරිතාගාර වායු විමෝචනය 1990 දී ඔවුන්ගේ වායු විමෝචන හා සැසඳීමේදී එම මට්ටමෙන් අවම අගයෙන් 5% ප්‍රමාණයක්

අඩුකරගත යුතු වේ. කැබිනට් මෙහෙයවීමට අනුව 2002/04/24 දින අංක 02/0392/116/004 දරන තීන්දුව අනුව 2002 සැප්තැම්බර් 03 දින ශ්‍රී ලංකා රජය කියෝතෝ සම්මුතියට එකඟ වන ලදී. පරිසර අමාත්‍යාංශය එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිලිබඳ වූ රාමුගත සම්මුතියේ විධායක කමිටුවෙහි සහ කියෝතෝ සම්මුතියේ නාභි ගත ලක්ෂය ලෙස ක්‍රියා කරේ.

පවිත්‍ර සංවර්ධන ව්‍යාපෘති වල ජාතික බලාත්මක අධිකාරිය ලෙස පවිත්‍ර සංවර්ධන ව්‍යාපෘති වලට අනුමැතිය ලබා දීම සිදු කල යුතු අතර එය ජාතික බලාත්මක අධිකාරියේ මූලික වගකීමක් වන අතර එසේ අනුමැතිය ලබා දීමේදී එම ව්‍යාපෘතීන් රටෙහි තිරසාර සංවර්ධන අරමුණු කරා ලඟා වීමට දායක වන්නේ කෙසේදැයි තීරණය කල යුතුය.

පවිත්‍ර සංවර්ධන ව්‍යාපෘති වල ජාතික බලාත්මක අධිකාරිය ලෙස ප්‍රගතිය වාර්තා කරන කාල පරිච්ඡේදය තුල මූලික ව්‍යාපෘති අදහස ඇගයීමෙන් එක් අනුමැතියක් ද, ව්‍යාපෘති යෝජනාව ඇගයීමෙන් සත්කාරක රට ලෙස අනුමැති 5ක් ද නිකුත් කර ඇත.

2.3.2 ග්‍රිඩ් විමෝචන සාධකය ප්‍රකාශයට පත් කිරීම (GEF)

ග්‍රිඩ් විමෝචන සාධකය යනු විදුලි බලයේදී එක් ඒකකයකින් විමෝචනය වන CO_2 ප්‍රමාණයයි. විවිධ ශක්ති බලාගාර ප්‍රධාන ජාලයට විදුලිය සපයනු ලැබේ. මෙම බලාගාර ගල් අඟුරු, ඩීසල්, ජල විය හැක. අවසන් පාරිභෝගිකයා විසින් පරිභෝජනය කරන මෙම විදුලිය එම විදුලි ප්‍රභව වල එකතුවකින් ජනනය වුවක් බවට උපකල්පනය කරනු ලබන අතර එමගින් විවිධ CO_2 මට්ටම් විමෝචනය කෙරේ.

2012 වර්ෂයේ ග්‍රිඩ් විමෝචක සාධකය ප්‍රකාශනයට පත් කිරීම ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් 2013 වර්ෂයේදී සිදුකරන ලදී.

2.3.3 ඉතා කුඩා පරිමාණ පවිත්‍ර සංවර්ධන ව්‍යාපෘති සඳහා automatic additionality

පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය පිලිබඳ විධායක කමිටුවේ 63 වන සහ 65 වන රැස්වීම් වලදී ගත් තීරණ වලට අනුව ඉතා කුඩා පරිමාණ පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය ව්‍යාපෘති සඳහා පහත අවශ්‍යතා සපුරාලිය යුතුය

- රැඳවුම් ධාරිතාව 5 MW වලට සමාන හෝ ඊට අඩු ජාලයට සම්බන්ධ පුනර්ජනනීය බලශක්ති තාක්ෂණ, විශේෂිත පුනර්ජනනීය බලශක්ති තාක්ෂණ /මිනුම්
- ජාලයට සම්බන්ධ විශේෂිත පුනර්ජනනීය බලශක්ති තාක්ෂණය සහ මුළු ජාලයෙහි බලශක්ති ධාරිතාවයට දක්වන අනුපාතය 3% හෝ ඊට අඩු විය යුතුය.

ඒ අනුව එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිලිබඳ වූ රාමුගත සම්මුතියේ විධායක කමිටුව (UNFCCC-EB) විසින් automatic additionality සඳහා රැඳවුම් ධාරිතාව 5 MW වලට සමාන හෝ ඊට අඩු ජාලයට සම්බන්ධ පුනර්ජනනීය බලශක්ති තාක්ෂණය අනුමැතිය ලබාදෙන ලදී.

2.3.4 දේශගුණික විපර්යාස අවම කිරීම පිලිබඳ ජාතික විශේෂඥ කමිටුව පිහිටුවීම. (NECCC - Mitigation)

ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස අවම කිරීම සඳහා ක්‍රියා කිරීමේ දී ඇතිවන ගැටළු වලදී මග පෙන්වීම සඳහා දේශගුණික විපර්යාස අංශය මගින් දේශගුණික විපර්යාස අවම කිරීම පිලිබඳ ජාතික විශේෂඥ කමිටුව පිහිටු වන ලදී. දේශගුණික විපර්යාස අවම කිරීම සඳහා ජාතික විශේෂඥ කමිටුවෙහි අරමුණු පහත ලෙස වෙයි.

- දේශගුණික විපර්යාස අවම කිරීම පිලිබඳ ජාතික සංවර්ධන ක්‍රියා දාමයට අනුකූලව දේශගුණික විපර්යාස අවම කිරීමේ ගැටලු පිලිබඳ මග පෙන්වීම.
- දේශගුණික විපර්යාස අවම කිරීම පිලිබඳ ප්‍රතිපත්ති, උපාය මාර්ග, ක්‍රියාකාරකම් සහ නීතිමය මෙවලම් සෑදීමට මග පෙන්වීම

- දේශගුණ විපර්යාස පිලිබඳ ජාත්‍යන්තර කථිකාවතෙහි රටෙහි දේශගුණික විපර්යාස අවම කිරීම පිලිබඳ රටෙහි තත්වය සකස් කිරීමට මග පෙන්වීම
- දේශගුණ විපර්යාස පිලිබඳ ජාත්‍යන්තර කථිකාවතට අනුව රටෙහි දේශගුණික විපර්යාස අවම කිරීමට ජාතික වශයෙන් යෝග්‍ය දේශගුණ විපර්යාස අවම කිරීම සඳහා ක්‍රියාකාරකම් සකස් කිරීම. (NAMAs)
- දේශගුණික විපර්යාස අවම කිරීම පිලිබඳ ක්‍රියාකාරකම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම උදෙසා මග පෙන්වීම
- පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රනය සහ කියොතෝ සන්ධානය යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රන ක්‍රියා කිරීමට මග පෙන්වීම
- විදේශ ආධාර යටතේ ඇති විදේශ ආධාර ලබන අවම කිරීමේ ව්‍යාපෘති සමාලෝචනය කිරීම

දේශගුණික විපර්යාස අවම කිරීම පිලිබඳ ක්‍රියාකාරකම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම උදෙසා මග පෙන්වීම අරමුණු කරගෙන දේශගුණික විපර්යාස අවම කිරීම පිලිබඳ ජාතික විශේෂඥ කමිටු (NECCC – Mitigation) රැස්වීම දෙකක් පැවැත්වුණි.

2.3.5 දේශගුණ විපර්යාස සඳහා අනුවර්තනය වීමේ ජාතික විශේෂඥ කමිටුව පිහිටුවීම.

පරිසර හා පුනර්ජනනීය බල ශක්ති අමාත්‍යාංශය විසින් සාදන ලද ජාතික දේශගුණ විපර්යාස ප්‍රතිපත්ති සහ අනුවර්තන උපායන් පදනම් කර ගනිමින් දේශගුණ විපර්යාස අංශය දැනට ජාතික දේශගුණ විපර්යාස සඳහා අනුවර්තනය වීමේ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම ආරම්භ කර ඇති අතර එම ක්‍රියාකාරී සැලැස්ම සැදීමට උපදෙස් ගැනීම සහ ශ්‍රී ලංකාව තුල දේශගුණ විපර්යාස අනුවර්තන ක්‍රියාකාරකම් පැවැත්වීම සඳහා උපදෙස් ලබා ගැනීම සඳහා 2012 සැප්තැම්බර් මස දේශගුණ විපර්යාස සඳහා අනුවර්තනය වීමේ ජාතික විශේෂඥ කමිටුවක් පිහිටුවන ලදී.

දේශගුණ විපර්යාස සඳහා අනුවර්තනය වීමේ ජාතික විශේෂඥ කමිටුවේ පරමාර්ථ.

- දේශගුණ විපර්යාස සඳහා රටේ ප්‍රවනතාව කලින් කලට දැනුවත් කිරීම සහ ඒ පිලිබඳ සංවේදීතාව වැඩි කිරීම.
- දේශගුණ විපර්යාස නිසා ජනතාවට සහ ඔවුන්ගේ ජීවනොපයන් සහ පරිසර පද්ධති සඳහා ඇති අහිතකර බලපෑම් අවම කිරීමට සහ මගහැරවීමට අනුවර්තන ක්‍රියාමාර්ග ගැනීම.
- තිරසාර සංවර්ධනයේදී හරිතාගාර වායු විමෝචනය අවම කිරීම.
- තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදනය දියුණු කිරීම.
- සමාජයේ පවතින දේශගුණ විපර්යාස වලට සම්බන්ධ විවිධ මුහුණුවරවල් ඇති ගැටළු පිලිබඳ දැනුම වැඩි දියුණු කිරීම සහ තීරණ ගැනීම්වලදී දුරදර්ශි තෝරාගැනීමක් කිරීමට ධාරිතාව වර්ධනය කිරීම.
- දේශගුණ විපර්යාස වල බලපෑම් වලට කාර්යක්ෂමව සහ ඵලදායි ලෙස මුහුණ දීමට රටේ ධාරිතාව වැඩි කිරීම.
- ජාතික සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රධාන ධාරාවට දේශගුණ විපර්යාස සම්බන්ධ ගැටළු ඇතුලත් කිරීම.

දේශගුණ විපර්යාස අනුවර්තන ගැටළු සඳහා මගපෙන්වීම් ලබාගැනීමේ අරමුණින් දේශගුණ විපර්යාස සඳහා අනුවර්තනය වීමේ දෙවන ජාතික විශේෂඥ කමිටු රැස්වීම 2012 දෙසැම්බර් මස 20 වන දින පැවති අතර 2013 ජූලි මස 17 වන දින තුන්වන ජාතික විශේෂඥ කමිටු රැස්වීම පැවැත්වුණි.

2.3.7 පළාත්බද (දකුණු පළාත්) හා ශ්‍රී ලංකාව සඳහා ජාතික දේශගුණික විපර්යාස වලට අනුවර්තනය වීමේ ක්‍රියාකාරී සැලසුම සකස් කිරීම.

මෙම ක්‍රියාකාරකම යටතේ දකුණු පළාත සඳහා පළාත්බද ක්‍රියාකාරී සැලසුම් 2020 ශ්‍රී ලංකාව සඳහා ජාතික දේශගුණික විපර්යාස වලට අනුවර්තනය වීමේ උපාය මාර්ග සකසන ලදී. මෙම ව්‍යාපෘතියෙන් ලැබෙන ප්‍රතිඵල වලට අනුව මෙම ක්‍රියාකාරී සැලසුම අනෙකුත් පළාත් සඳහා ද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

ක්‍රියාකාරී සැළසුම පිළියෙළ කිරීමේ දී එය සාමූහිකත්ව ප්‍රවේශයක් හරහා සිදු කරන අතර, පහළම මට්ටමේ සිට ඒ සඳහා දායකත්වය ලබා ගනු ලබයි. මෙහිදී පහළම මට්ටමේ සිටින ජනතාව වර්තමානයේ මුහුණදෙන මූලික ගැටළු හඳුනා ගැනීමට අපේක්ෂිත අතර ඒවා සඳහා අනුවර්තනය විය හැකි ප්‍රායෝගික විසඳුම් ද හඳුනාගැනීමට අපේක්ෂිතය. පළාත්බද ක්‍රියාකාරී සැලසුම් 2020 ශ්‍රී ලංකාව සඳහා ජාතික දේශගුණික විපර්යාස වලට අනුවර්තනය වීමේ උපාය මාර්ග (PCCAAP - 2012) සකසනු ලබන්නේ ජාතික දේශගුණික විපර්යාස ප්‍රතිපත්තිය (NCCP 2012) විෂය පථය තුළ වන අතර, ජාතික දේශගුණික විපර්යාස වලට අනුවර්තනය වීමේ උපාය මාර්ග (PCCAAP - 2012) සමඟ හැකි තරම් දුරට දිශානති කොට සකසනු ලබයි. මෙම මූලික ප්‍රතිපත්ති හා උපාය මාර්ග මගින් පෙන්වා දෙන අන්දමට දේශගුණික විපර්යාස හා බැඳී ඇති අපේක්ෂිත තත්වයන් හා ජීවත්වීම සහ ඒවා දරාගෙන සිටීම තව දුරටත් තෝරා ගත් යුතු තත්වයක් නොව ඉතා වැදගත් අංගයකි.

2.3.8 දේශගුණික විපර්යාස ගැටළු සම්බන්ධව දැනුවත් කිරීම හා ශක්‍යතා වර්ධනය

රාජ්‍ය සේවකයින් සඳහා දේශගුණික විපර්යාස පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහනක් 2013.01.24 වන දින දකුණු පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, ගොවිජන සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන හා පාරිසරික කටයුතු අමාත්‍යාංශයේ දී පැවැත්විය. එසේම රාහුල විද්‍යාලයේ සිසුන්, ගුරුවරුන් හා රාජ්‍ය සේවකයින් සඳහා ද, එක් දින වැඩමුළුවක් පැවැත්වුණි. දේශගුණික විපර්යාස වල බලපෑම් වලින් තොර ලොවක් මැයෙන් පෝස්ටර් තරඟයක් පාසැල් සිසුන් සඳහා පැවැත්වුණි.

2.3.9 දේශගුණික විපර්යාස පිළිබඳ තාක්ෂණික අවශ්‍යතා ඇගයුම් ව්‍යාපෘතිය

තාක්ෂණික අවශ්‍යතා ඇගයීමේ ව්‍යාපෘතිය දිවයින පුරා ක්‍රියාත්මක වන වැඩපිළිවෙළක් වන අතර මෙමගින් දේශගුණික විපර්යාස සඳහා අනුවර්තනය වීම හා ඒවා අවම කිරීම සඳහා වන තාක්ෂණික අවශ්‍යතා හඳුනා ගැනීම හා ප්‍රමුඛතාකරණය, විශේෂයෙන් දියුණු වන රටවල් සඳහා සිදු කරනු ලබන්නකි. පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය, එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය හා කියතෝ සන්ධානයේ කේන්ද්‍රස්ථානය වශයෙන් ක්‍රියා කරනු ලබයි. ජගත් තාක්ෂණික අවශ්‍යතා ඇගයුම් ව්‍යාපෘතිය, ජගත් පාරිසරික පහසුකම (GEF) සමඟ එක්ව එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩ සටහන මගින් නිර්මාණය කොට ඇති අතර, මෙහි අරමුණ වනුයේ, එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය (UNFCC) තුල වඩාත් දියුණු ලෙස තාක්ෂණික අවශ්‍යතා ඇගයුම් සිදු කිරීමට සංවර්ධනය වන රටවලට අවශ්‍ය පහසුකම් ලබාදීමයි. පාරිසරික හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය, ශ්‍රී ලංකාව සඳහා තාක්ෂණික අවශ්‍යතා ඇගයුම හා තාක්ෂණික ක්‍රියාකාරී සැළසුමක් සැකසීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි.

අනුවර්තනය හා අවම කිරීම සඳහා තාක්ෂණික අවශ්‍යතා ඇගයුම, බාධක විශ්ලේෂණය, අනුවර්තනය හා අවම කිරීම සඳහා හඳුනාගත් තාක්ෂණික ක්‍රමවේදයන්ට අවශ්‍ය සුදුසු රාමුගත පද්ධතිය සකසා දීම, වෙළඳපල ඇගයීම,

අනුවර්තනය හා අවම කිරීම සඳහා තාක්ෂණික ක්‍රියාකාරී සැලසුම, එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩ සටහන සඳහා අනුවර්තනය හා අවම කිරීම වෙනුවෙන් ව්‍යාපෘති අදහස් සඳහා වන වාර්තාවක් සම්පූර්ණ කොට ඉදිරිපත් කර ඇත.

තාක්ෂණික අවශ්‍යතා ඇගයුම, බාධක විශ්ලේෂණය හා අනුවර්තනය හා අවම කිරීම සඳහා අවශ්‍ය රාමුගත පද්ධතිය සකසා දීම හා තාක්ෂණික ක්‍රියාකාරී සැළස්ම සඳහා වන ව්‍යාපෘතිවල අවසන් වාර්තා දෙක සැකසීම අවසන්කර ඇත.

2.3.10 ශ්‍රී ලංකාවේ මහවැලි ගංගා ද්‍රෝණිය ආශ්‍රිතව ජීවත්වන කෘෂිකාර්මික ප්‍රජාව සඳහා දේශගුණික විපර්යාස වල බලපෑම සම්බන්ධව සළකා බලනු ලබන ව්‍යාපෘතිය

දේශගුණික විපර්යාස අංශය, මෙම ව්‍යාපෘතිය සඳහා හුදු විධායක ආයතනය ලෙස ක්‍රියා කරන අතර, ලෝක ආහාර වැඩ සටහන, ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස කටයුතු කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කොට ඇති මුළු මුදල ඇමෙරිකානු ඩොලර් 7,989,727 කි.

ඉලක්කගත ප්‍රදේශ : නුවරඑළිය දිස්ත්‍රික්කය - වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
: පොළොන්නරුව දිස්ත්‍රික්කය - මැදිරිගිරිය, ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

සමස්ත අරමුණ : භූමිය හා ජල සම්පත් කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම තුළින් මහවැලි ගංගා ද්‍රෝණි ආශ්‍රිතව ජීවත්වන ගොවි ප්‍රජාව සඳහා විවිධාංගීකරණය වූ ප්‍රත්‍යස්ථ ජීවනෝපාය මාර්ගයන් ඇතිකරලීම

ප්‍රධාන අරමුණ : මහවැලි ගංගා ද්‍රෝණියේ හානියට ලක්වීමට ඉඩ ඇති ප්‍රදේශ 03 ක වෙසෙන ගොවි ජනතාව දේශගුණික විපර්යාස හා උත්තේජක නිසා සිදුවිය හැකි හානි අවම කිරීම හා එම ප්‍රදේශ වල වෙසෙන ගොවි ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව නංවාලීම

සංඝටක

1 වන සංඝටකය ⟶ මැදිරිගිරිය, ලංකාපුර හා වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල වැසි ජලයෙන් ජීවත්වන ගොවි ප්‍රජාවගේ ගෘහස්ථ ආහාර සුරක්ෂිතතාව නඟා සිටුවීම හා ඔවුන්ට ප්‍රත්‍යස්ත ජීවනෝපාය මාර්ග ඇති කරලීම

2 වන සංඝටකය ⟶ දේශගුණික විපර්යාස නිසා උත්තේජිත වර්ෂාපතනයන්ට ගොදුරුවීමේ අවධානම හා බැඳී ඇති තත්වයන් අවම කිරීම සඳහා ග්‍රාමීය, පළාත්, කලාපීය සේවා ලබාදීමට අවශ්‍ය ආයතනික හැකියාව ගොඩ නැගීම

ව්‍යාපෘතියේ ප්‍රගතිය

පවත්වා ඇති වැඩමුළු

#	වැඩමුළුව	ස්ථානය	දිනය
1	හැඩගැස්වීම සඳහා වන වැඩමුළුව	කොත්මලේ නිවාඩු නිකේතනය	2013. 06. 27 - 28
2	දැනුවත් කිරීමේ වැඩමුළුව	වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	2013. 08. 23 – 24 2013. 08. 28 – 29 2013. 09. 13 – 14
3	පූර්ව ආරම්භක වැඩමුළුව	වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	2013. 04. 17, 26 2013. 10. 03 – 04 2013. 10. 03 – 04
4	ආරම්භක වැඩමුළුව	අතුරුගිරිය NIPM ආයතනය	2013. 11. 04 – 05

මේ සඳහා වන ගිවිසුම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජය හා ලෝක ආහාර සංවිධානය අතර 2013 දෙසැම්බර් 23 වන දින අත්සන් කිරීම මගින් එහි ක්‍රියාකාරිත්වය ආරම්භ විය.

2.3.11 තුන්වන ජාතික සන්නිවේදන ව්‍යාපෘතිය සැකසීම

ශ්‍රී ලංකාව දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය ((UNFCC) 1993 නොවැම්බර් මස අපරානුමත කොට ඇති අතර, එය එසේ අපරානුමත කළ මුල්ම රටවල් 50 අතරට ද ශ්‍රී ලංකාව එක්වේ. එකී එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ වගකීම් වලට අනුව, ශ්‍රී ලංකාව විසින් කලින් කලට දේශගුණික විපර්යාස පිළිබඳ ජාතික සන්නිවේදන වාර්තාවක් සැකසිය යුතුය.

2013 වර්ෂයේ පහත සඳහන් පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කොට ඇත.

1. බලශක්තිය, කර්මාන්ත ක්‍රියාවලි, අපද්‍රව්‍ය, හා කෘෂිකාර්මික ක්ෂේත්‍ර සඳහා හරිතාගාර වායු ඉන්වෙන්ට්‍රිය සැකසීම
2. බලශක්ති හා බලශක්තිය නොවන ක්ෂේත්‍ර වල අවම කිරීමේ ඇගයීම්
3. කෘෂිකාර්මික හා ජල ක්ෂේත්‍ර වල ගොදුරු විය හැකි හා අනුවර්තනය විය හැකි තත්වයන් පිළිබඳ ඇගයීම

2.3.12 දේශගුණික විපර්යාස පිලිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය හා කියතෝ සංධානයෙහි ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම

i. එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ ලේකම් කාර්යාලයට වාර්තා සැපයීම

දේශගුණික විපර්යාස පිලිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය හා කියතෝ සංධානයෙහි පාර්ශ්වකරුවන් වශයෙන් ශ්‍රී ලංකාව දිගු කාලීන සහයෝගිතා ක්‍රියාවලි වල තත්කාර්ය ක්‍රියාකාරී කණ්ඩායම, කියතෝ සන්ධානයේ තත්කාර්ය ක්‍රියාකාරී කණ්ඩායම, ක්‍රියාත්මක කිරීම සඳහා වන අතිරේක මඩුල්ල (SBI), විද්‍යාත්මක තාක්ෂණය හා උපදෙස් සඳහා වන අතිරේක මඩුලු (SBSTA) යන ඒවායේ ප්‍රතිඵල පදනම් කොට ගෙන අදාල තොරතුරු හා අදහස් සැපයිය යුතුය. මෙම තොරතුරු සකසා ඒවා නිසි කලට එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිලිබඳ රාමුගත සම්මුතියට සැපයීම ඉතා වැදගත් කටයුත්තකි. මෙම තොරතුරු දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුති ලේකම් කාර්යාලයට ලබාදීමෙන් ඔවුන්ට ඉතා වැදගත් ලේඛණ පිළියෙළ කිරීමට හැක. 2013 වර්ෂයේ දී වාර්තා 02 ක් දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුති ලේකම් කාර්යාලයට ඉදිරිපත් කර ඇත.

ii. COP 20 පිළියෙළ කිරීම

එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ සම්මන්ත්‍රණය (COP 19) පෝලන්තයේ වෝර්සෝ හි දී 2013 නොවැම්බර් 11 සිට 22 දක්වා පැවත්වුණි. මේ සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් නිලධාරින් 07 දෙනෙක් පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය ද ඇතුළුව සහභාගි විය. ඔවුන් COP, AWGKP, ADP, හා SBI මෙන්ම SABSTA සමුළු වල න්‍යාය පත්‍රයේ සඳහන් අංගයන්ට ක්‍රියාකාරීව සහභාගි වූ අතර ඒ පිළිබඳ ශ්‍රී ලංකාවේ මතය ඔවුන් විසින් ඉදිරිපත් කරන ලදී.

iii. අනුවර්තනයවීමේ පදනම යටතේ සිදු කරන ක්‍රියාකාරකම්

අනුවර්තනයවීමේ පදනම පිහිටවනු ලැබුයේ බෙහෝ දුරට අවධානමට ලක්විය හැකි රටවල් හා ප්‍රජාවන් සඳහා මූලික අනුවර්තනය වීමේ ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම සඳහාය. එබැවින් අනුවර්තනය වීමේ පදනම යටතේ මූල්‍ය පහසුකම් ලබා ගැනීමට අපේක්ෂා කරන පාර්ශ්වයන් ජාතික ක්‍රියාත්මක කරවීමේ ආයතනය හරහා එය කෙළින්ම ලබාගත හැක. ජාතික ක්‍රියාත්මක කරවීමේ ආයතනය පාර්ශ්වයන් විසින් යෝජනා කරන ලද ජාතික නීතිමය ආයතනයයි. අනුවර්තනය වීමේ පදනමේ මණ්ඩලය, එලෙස තෝරා ගනු ලැබූ ක්‍රියාත්මක කරවීමේ ආයතනය එම මණ්ඩලය විසින් පිහිටවනු ලැබූ භාරකාරත්ව සම්මතයන්ට අනුමත විය යුතුය. අනුවර්තනය වීමේ පදනම යටතේ මූල්‍යාධාර ලබන ව්‍යාපෘති හා වැඩ සටහන් වල සමස්ත කළමනාකාරිත්වය සම්බන්ධ සම්පූර්ණ වගකීම ජාතික ක්‍රියාත්මක කිරීමේ ආයතනය මගින් භාර ගන්නා අතර මූල්‍ය, මෙහෙයුම් හා වාර්තාකරන වගකීම් ද දරනු ලබයි. කෙසේ වෙතත් ශ්‍රී ලංකාව අනුවර්තනය වීමේ පදනම යටතේ මෙම පහසුකම් ලබා ගැනීම අවශ්‍ය වන පිළිගැනීම තවම ජාතික ක්‍රියාත්මක කරවීමේ ආයතනය හරහා ලබා ගෙන නොමැති අතර මෙම ව්‍යාපෘතිය මගින් අනුවර්තනය වීමේ පදනම යටතේ මූල්‍යාධාර ලබා ගැනීමට අවශ්‍ය සෘජු හැකියාව ලබා ගැනීමට උපකාර වනු ඇත. ඒ අනුව එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩ සටහන (ප්‍රාදේශීය කාර්යාලය) මෙම ජාතික ක්‍රියාත්මක කරවීමේ ආයතනයේ පිළිගැනීම ලංකාවට ලබා ගැනීම සඳහා තාක්ෂණික හා මූල්‍ය සහය ලබාදීමට එකඟ වී ඇත.

ඒ අනුව ජාතික ක්‍රියාත්මක කරවීමේ ආයතනයේ පිළිගැනීම ශ්‍රී ලංකාව සඳහා ලබා ගැනීමේ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මූල්‍ය අනුමැතිය විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, හා ජාතික සැළසුම් දෙපාර්තමේන්තුව විසින් 2013 වසරේ ලබා ගෙන ඇති අතර, එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩ සටහන හා මෙම අමාත්‍යාංශය අතර අත්සන් තබා ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මෙම ව්‍යාපෘතියට ඇමරිකානු ඩොලර් 9000 ක් ලැබී ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා සැළසුම් කර ඇති කාර්යයන් 2014 දී සම්පූර්ණ වීමට නියමිතය.

2.3.13 ශ්‍රී ලංකාව තුල හයිඩ්‍රො ක්ලෝරො ෆ්ලොරො කාබන් භාවිතය හා ආනයනය පාලනය

ශ්‍රී ලංකාව 2013 ජනවාරි මාසයේ සිට හයිඩ්‍රො ක්ලෝරො ෆ්ලොරො කාබන් භාවිතය තුරන් කිරීමේ වැඩ සටහන ක්‍රියාත්මක කරන අතර මෙය ශ්‍රී ලංකා රජය විසින් මොන්ට්‍රියල් සංධානය හා එකමුතුව ගනු ලැබූ තීරණයකි. ක්‍රමානුකූලව හයිඩ්‍රො ක්ලෝරො ෆ්ලොරො කාබන් ආනයනය පාලනය කිරීම සඳහා කෝටා ක්‍රමයක් හඳුන්වා දී ඇති අතර සුදුසුකම් ලත් ආනයනකරුවන්ට ඒවා ලබා දෙනු ඇත. 2013 වර්ෂය සඳහා කෝටා ලබා ගැනීමට ආයතන 25 ක් සුදුසුකම් ලබා ඇත.

මේ සඳහා 2013 වර්ෂයේ අගෝස්තු 01 වන දින අංක 1821/40 දරන අති විශේෂ ගැසට් පත්‍රය 1969 අංක 01 දරන ආනයන අපනයන (පාලන) පනත යටතේ හයිඩ්‍රො ක්ලෝරො ෆ්ලොරො කාබන් භාවිතය පාලනය හා ආනයනය නීත්‍යානුකූල ලෙස පාලනය සඳහා නිකුත් කොට ඇත.

2.4 භූමිය වෙරළ තීරය හා අවට මුහුද ඥනාන්විත ලෙස පරිහරණය කිරීම

පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය, සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය හරහා, නෞකාවල ක්‍රියාකාරිත්වය නිසා සිදු වන්නාවූ පරිසර දූෂණය මෙන්ම ශ්‍රී ලංකාවට අයත් ජල තීරයේ වෙරළාශ්‍රිතව සිදු වන්නාවූ ක්‍රියාකාරකම් වැළැක්වීම, අවම කිරීම, පාලනය හා කළමනාකරණය සඳහා බැඳුම්කරයක් ඇති කර ගෙන ඇත.

වෙරළ තීරය හා අවට මුහුද ඥනාන්විත ලෙස පරිහරණය කිරීම නම් වූ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා ඉටු කර ඇති ප්‍රධාන ක්‍රියාකාරකම් පහත දක්වා ඇත.

2.4.1"අනාගතයටත් කඩොලාන" වැඩ සටහන

"අනාගතයටත් කඩොලාන" වැඩ සටහන ලෝක සංරක්ෂණ සංගමය (IUCN) හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන (UNDP) මගින් දියත් කරන ලද අතර මෙම වැඩ සටහනේ දී FAO, UNEP, CARE, WI, Norad, Sida යනාදී ආයතන සමඟ ඒකාබද්ධ වී වැඩ කටයුතු කරගෙන යනු ලැබේ. "අනාගතයටත් කඩොලාන" වැඩ සටහන සහභාගිත්ව ප්‍රවේශයක් තුළින් ක්‍රියාත්මක වන වැඩ සටහන් වන අතර එය ඉන්දියාව, ඉන්දුනීසියාව, මාල දිවයින, පාකිස්ථානය, සීෂෙල්ස්, ශ්‍රී ලංකාව, තායිලන්තය හා වියට්නාමය යනාදී රටවල් තුල ක්‍රියාත්මක වේ. වෙරළ කළාප සංවර්ධන ක්‍රියාවලියේ දී පාරිසරික තිරසරභාවය ශක්තිමත් කිරීම හා තිරසර සංවර්ධනයක් ඇති කිරීම සඳහා වෙරළ ආශ්‍රිත පරිසර පද්ධති කළමනාකරණය සඳහා ආයෝජනය ප්‍රවර්ධනය කිරීම මෙම වැඩ සටහනේ අරමුණු ලෙස දැක්වේ.

"අනාගතයටත් කඩොලාන" වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේ දී වගකීම් දරණ ආයතනය සහ කලාපීය මෙහෙයුම් කමිටුවේ ශ්‍රී ලංකා නියෝජනය දරණ කේන්ද්‍රීය ආයතනය වශයෙන් පරිසර අමාත්‍යාංශය කටයුතු කරනු ලබයි. ජාතික මට්ටමෙන් "අනාගතයටත් කඩොලාන" වැඩ සටහන ක්‍රියාවට නැංවීමේ දී සම්බන්ධීකරණය හා මෙහෙයුම් කටයුතු සිදු කිරීම සඳහා ජාතික මෙහෙයුම් කමිටුවක් ස්ථාපිත කර ඇති අතර එය රාජ්‍ය ආයතන, අධ්‍යයන ආයතන යනාදියෙන් සමන්විත වේ. මෙම කමිටුව මගින් වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට අදාල විවිධ කරුණු සාකච්ඡා කිරීමටත් එතුලින් ඵලදායි හා කාර්යක්ෂම තීරණ ගැනීමටත් සලස්වන අතර වෙරළ සම්පත් භාවිතය සම්බන්ධයෙන් සහභාගිත්ව කළමනාකරණ ප්‍රවේශයකට යොමුවීම ප්‍රවර්ධනය කරනු ලබයි.

2013 වසරේ නව සාමාජිකයින් ලෙස නාගරික සංවර්ධන අධිකාරිය, නාරා ආයතනය හා ජාතික ධීවර සහයෝගිතා ව්‍යාපාරය එක් විය. ප්‍රගතිය වාර්තා කරනු ලබන කාලය තුල ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් 5 ක් පවත්වන ලදී. පළමු අදියර යටතේ ව්‍යාපෘති 38 කට මූල්‍යාධාර සපයමින් ඒවා සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. දෙවන අදියර යටතේ කුඩා පරිමාණ ප්‍රතිපාදන ව්‍යාපෘති සිදු කරනු ලබන අතර එය චක්‍ර 4 කින් සමන්විතය.

කුඩා පරිමාණ ප්‍රතිපාදන ව්‍යාපෘතියේ අති පිහිතවන චක්‍ර 1 හා 2 මගින් ව්‍යාපෘති 32 ක් ප්‍රදානය කරනු ලැබූ අතර සියල්ල නිම කර ඇත. අදියර දෙකෙහි 3 වන චක්‍රයේ මෙහෙයුම් 2013 ජනවාරි මස ආරම්භ කරනු ලැබූ අතර එහි කටයුතු 2014 දෙසැම්බර් මස නිම කිරීමට නියමිතය. මෙම චක්‍රයේ ප්‍රදාන අගයේ ඉහළ සීමාව දේශීය මුදල් රු.2,000,000 දක්වා ඉහළ දමා ඇත. ව්‍යාපෘතිය ක්‍රියාවට නංවන භූගෝලීය ප්‍රදේශ ද වෙනස් කරනු ලැබූ අතර එම නව ප්‍රදේශ වනුයේ යාපන කලපුව, කොණ්ඩමනාර් කලපුව, කෝකිලායි හා නයාර් කලපුව, මනල්කඩු වැලි පරය, ඩෙල්ෆ්ට් දිවයින හා මඩකලපුවයි. ප්‍රතිපාදන 4 ක් මේ වන විට ප්‍රදාන කර ඇති අතර එහි කටයුතු සිදු කරමින් පවතී.

2.5 භූමිය වගකීමෙන් යුතුව පරිහරණය කිරීම

පහත දක්වා ඇත්තේ භූමිය වගකීමෙන් යුතුව පරිහරණය කිරීමේ දැක්ම සඳහා සිදු කෙරෙන මූලික ක්‍රියාකාරකම්ය. එක්සත් ජාතීන්ගේ කාන්තාරකරණය පිටු දැකීමේ සම්මුතියේ කේන්ද්‍රස්ථානය වශයෙන් ක්‍රියා කරන පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයට එම සම්මුතියේ ඇති අවශ්‍යතා සම්පූර්ණ කිරීමට ප්‍රතිපත්ති සම්බන්ධීකරණය හා සැකසීම සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට බැඳී සිටී.

2013 වසරේදී හරිත ලංකා මෙහෙවර 05 ට අදාළව සිදු කරනු ලැබූ ක්‍රියාකාරම් පහත පරිදි වේ.

2.5.1 එක්සත් ජාතීන්ගේ කාන්තාරකරණය වැලැක්වීමේ සම්මුතියේ දස අවුරුදු උපායමාර්ගයට අනුකූලව ශ්‍රී ලංකාවේ භූමි හායනය වැලැක්වීම සඳහා පිළියෙල කළ ජාතික ක්‍රියාකාරී වැඩසටහන යාවත්කාලීන කිරීම

එක්සත් ජාතින්ගේ කාන්තාරකරණය වැලැක්වීමේ සම්මුතියේ පාර්ශවකරුවකු වශයෙන් එම සම්මුතියේ අවශ්‍යතාවයට අනුව ශ්‍රී ලංකාවේ භූමි හායනය වැලැක්වීම හා නියගයේ ආදීනව පිටුදැකීමේ අරමුණින් 2002 වසරේදී පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය විසින් ජාතික ක්‍රියාකාරී වැඩසටහන සකස් කරන ලදී.

බොහොමයක් රටවල් තම ජාතික ක්‍රියාකාරී සැලැස්ම සැකසුවද, විවිධ හේතු නිසාවෙන් එය ක්‍රියාත්මක නොකරන බව එක්සත් ජාතීන්ගේ කාන්තාරකරණය වැලැක්වීමේ සම්මුතිය විසින් නිරීක්ෂණය කරනු ලැබ ඇත. එබැවින් ඊට විසඳුමක් ලෙස මෙම තත්ත්වය විශ්ලේෂණය කොට, පාර්ශ්වකරුවන්ගේ 8 වන සමුළුවේදී, සම්මුතියේ ඇති ක්‍රියාකාරකම් වඩාත් ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීම සඳහා දස අවුරුදු උපායමාර්ග සැලැස්ම හා රාමුවක් සැකසීමට තීරණය කරන ලදී.

එම දස අවුරුදු උපායමාර්ගයට අනුකූලව ඉහත ජාතික ක්‍රියාකාරී වැඩසටහන යාවත්කාලීන කිරීම උපදේශණ සේවාවක් ලබාගනිමින් 2013 වසර අවසාන වන විටද එය අඛණ්ඩව සිදු කරමින් පවති. 2013 වසරේදී පරිසර හා පුනර්ජනීය බලශක්ති අමාත්‍යාංශය විසින් මෙම යාවත්කාලීන කිරීමට අදාළව පාර්ශවකරුවන් සහභාගී කරගනිමින් වැඩමුළු 2ක් පවත්වන ලද අතර එම වැඩමුළු 2 හි ප්‍රතිඵලයක් ලෙස ජාතික ක්‍රියාකාරී වැඩසටහනෙහි පළමු සහ දෙවන කෙටුම්පත් පිළියෙල කරන ලදී. එසේ පිළියෙල කරනු ලැබූ කෙටුම්පත් පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන වෙත ඉදිරිපත් කරන ලදී.

2.5.2 ශ්‍රී ලංකාවේ තිරසර භූමි කළමනාකරණය සඳහා ඒකාබද්ධ මූල්‍ය උපායමාර්ගයක් පිළියෙල කිරීම

ඒකාබද්ධ මූල්‍ය උපායමාර්ගයක් යනු තිරසාර භූමි කළමනාකරණයට අදාළ වන වැඩසටහන් හා ව්‍යාපෘතීන් වලට අවශ්‍ය වන මූල්‍ය සම්පත් සොයාගැනීම සඳහා සකස් කරන ලද නියාමන රාමුවකි.

එකසත් ජාතීන්ගේ කාන්තාරකරණය වැලැක්වීමේ සම්මුතියේ මාර්ගෝපදේශයන්ට අනුව, සහ ජාතික ක්‍රියාකාරී වැඩසටහන ක්‍රියාවට නැංවීමේ අවශ්‍යතාවය පිළිබඳ සැලකිල්ලට ගනිමින් තිරසර භූමි කළමනාකරණය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය උපායමාර්ගයේ පළමු කෙටුම්පත ස්වභාවික සම්පත් කළමනාකරණ අංශය විසින් 2013 වසරේදී පිළියෙල කරන ලදී. ඉන් අනතුරුව එම පළමු කෙටුම්පත වැඩිදුර අදහස් ලබාගැනීම සඳහා භූමිහායනය වැලැක්වීම සඳහා වූ ජාතික විද්වත් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.මෙය 2013 වසර අවසානය වනවිටත් අඛණ්ඩව සිදු කෙරෙමින් පවතින ක්‍රියාකාරකමක් වන අතර ඒකාබද්ධ මූල්‍ය උපායමාර්ගයක් සැකසීමේ ඒකායන බලාපෙරොත්තුව වන්නේ දේශීය, විදේශීය හා සම්පත් ඒකරාශී කරමින් ආයෝජන රාමුවක් සකස් කිරීම වේ. එක්සත් ජාතීන්ගේ කාන්තාරකරණය වැලැක්වීමේ සම්මුතිය යටතේ ජාතික ක්‍රියාකාරී වැඩසටහනක් සැකසීම, ඒකාබද්ධ මූල්‍ය උපායමාර්ගය සම්පාදනය සඳහා පිටිවහලක් වී තිබේ.

2.5.3 ශ්‍රී ලංකාව විසින් 2013 ජගත් කාන්තාරකරණය වැලැක්වීමේ දිනය ජාතික වශයෙන් සැමරීම

2013 ජගත් කාන්තාරකරනය වැලැක්වීමේ දිනය සැමරීමේ ජාතික උත්සවය නුවරඑළිය දිස්ත්‍රික්කයේ හගුරන්කෙත අධිකාරීගම ස්වර්ණදීප ප්‍රාථමික විදුහලේදී පවත්වන ලදී.

හගුරන්කෙත ප්‍රාදේශීය ලේකම්, නුවරඑළිය දිස්ත්‍රික් ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ස්වභාවික සම්පත් කළමනාකරණ ආයතනය සහ ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ සහාය ඇතිව පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් මෙම ජාතික උත්සවය සංවිධානය කරන ලද අතර මේ සඳහා ප්‍රදේශයේ දේශපාලන අධිකාරිය, රජයේ ආයතන වල නිළධාරීන්, ප්‍රදේශයේ ගොවි ජනතාව මෙන්ම පාසල් දරු දැරියන්ගේ සහාය නොමදව මේ සඳහා ලැබිණි.

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව මගින් හඳුන්වාදුන් ප්‍රදේශයට උචිත බෝග වර්ග හා පාංශු සංරක්ෂණ ක්‍රම යොදා ගනිමින් තෝරාගත් භායනයට පත්වී තිබූ ඉඩම් පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහනක් මෙම ජාතික උත්සවයට සමගාමීව පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් දියත් කරනු ලැබූ අතර එදින ඉහත වැඩසටහන සඳහා තෝරාගනු ලැබූ ප්‍රතිලාභී පවුල් වෙත පලතුරු පැල හා කාබනික පොහොර බෙදා දීමද මෙදිනම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ස්වභාවික සම්පත් කළමනාකරණ ආයතනය මගින් භායනයට පත්වී තිබෙන ඉඩම් සඳහා උචිත පාංශු සංරක්ෂණ ක්‍රම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළුවක් ද පවත්වනු ලැබීය.

2.5.4 නියමු ව්‍යාපෘතීන් ලෙස වලපනේ හා හගුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල තෝරාගත් භායනයට ලක් වූ කෘෂිකාර්මික ඉඩම් පුනරුත්ථාපනය කිරීම

2012 හා 2013 වසර වල ජගත් කාන්තාරකරණය වැලැක්වීමේ දිනය සැමරීම නිමිත්තෙන් වලපනේ හා හගුරන්කෙත යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 2හි භායනයට පත්වූ ඉඩම් සඳහා සුදුසු පාංශු සංරක්ෂණ ක්‍රම යොදාගනිමින් එම ඉඩම් පුනරුත්ථාපනය කිරීමේ නියමු ව්‍යාපෘතීන් 2ක් ආරම්භ කරන ලදි.

වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පන්නල හා සේරුපිටිය යන ග්‍රාම නිළධාරී වසම් දෙකෙහි පවුල් 62 කට මෙම වැඩසටහන මගින් ප්‍රතිලාභ සැලසෙන අතර 2013 වර්ෂය අවසාන වනවිට මුළු වැඩසටහනින් 80% පමණ කටයුතු අවසන් කිරීමට හැකි වී තිබිණි. පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය මෙන්ම වලපනේ ප්‍රාදේශීය ලේකම්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ මෙම වැඩසටහන තවදුරටත් ක්‍රියාත්මක වෙමින් පවතී.

හගුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වැලිකඩ ග්‍රාම නිළධාරී වසම තුල ආරම්භ කරනු ලැබූ පාංශු සංරක්ෂණ වැඩසටහන මගින් එම ග්‍රාම නිළධාරී වසමේ ගොවි පවුල් 115 ක් සඳහා මින් ප්‍රතිලාභ හිමි වනු ඇත.

2.6 කසළින් තොර වටපිටාවක්

කසළින් තොර වටපිටාවක් යන මෙහෙවර යටතේ සිදු කරනු ලැබූ ප්‍රධාන ක්‍රියාකාරකම් පහතින් සඳහන් කොට ඇත.

2.6.1 ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණයට ජාතික ක්‍රියකාරී සැලැස්මක් සැකසීම - තෝරාගත් ආසියාතික රටවල පොලික්ලෝරිනිකෘත බයිෆීනයිල සම්බන්ධ හැකියා වර්ධනය හා තොරතුරු හුවමාරුව සම්බන්ධ ජාත්‍යන්තර රසායන ද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ උපාය මාර්ගික ප්‍රවේශය

පොලික්ලෝරිනිකෘත බයිෆිනයිල අපද්‍රව්‍ය හා එයින් අපවිත්‍ර වූ උපකරණ කළමනාකරණය හා බැහැරලීම සම්බන්ධ ආරම්භක වැඩමුළුවක් 2013.08.07 දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පවත්වනු ලැබීය.

2.6.2 බියගම පළාත් පාලන ප්‍රදේශය තුල කසළ කළමනාකරණ නියමු වැඩ සටහන් පැවැත්විය. මෙහි අරමුණ වූයේ නිෂ්පාදකයින්ගේ මේ සඳහා ප්‍රවේයක් ඇති කිරීම සහ සංකීර්ණ අපද්‍රව්‍ය (අධික දූෂණ විභවයක් ඇති කාබනික නොවන අපද්‍රව්‍ය) කළමනාකරණය සඳහා විවිධ පාර්ශ්වකරුවන් සංවිධානය කිරීමයි.

2.6.3 කඩුවෙළ මහනගර සහා ප්‍රදේශය තුල කසළ කළමනාකරණ නියමු වැඩ සටහන් පැවැත්විම. මෙහිද අරමුණ වූයේ නිෂ්පාදකයින්ගේ මේ සඳහා ප්‍රවේයක් ඇති කිරීම සහ සංකීර්ණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විවිධ පාර්ශ්වකරුවන් සංවිධානය කිරීමයි.

2.6.4 බියගම මාවරමණ්ඩිය සති පොළෙහි ජීව වායු නියමු ඒකකයක් පිහිටුවීම
වෙළඳපල කාබනික අපද්‍රව්‍ය භාවිතය සඳහා තිරසාර ආකෘතියක් ගොනැගීමට ඇති වටිනාකම හා අවශ්‍යතාව සැළකිල්ලට ගෙන, අමාත්‍යාංශය විසින් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන හා සමගාමීව, බියගම මාවරමණ්ඩිය සතිපොලෙහි ජීව වායු නියමු ඒකකයක් ස්ථාපිත කරන ලදී.

2.7 සැමට සැමදා ජලය

සැමට සැමදා ජලය යන මෙහෙවර යටතේ සිදු කෙරෙනු ප්‍රධාන ක්‍රියාකාරකම් පහතින් දක්වා ඇත.

2.7.1 පවිත්‍ර ගංගා වැඩ සටහන

ජලයේ ගුණාත්මකභාවය විශ්ලේෂණය කිරීමේ වැඩ සටහන් සහ ජලයේ ගුණාත්මකබව පිළිබඳ තොරතුරු මණ්ඩල ඇති කිරීම

පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා ඒකාබද්ධව කැළණි ගඟේ ජලයේ ගුණාත්මකභාවය සතියකට වරක් අධීක්ෂණය කරනු ලබයි. ජනතාව දැනුවත් කිරීම සඳහා ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ තොරතුරු ප්‍රදර්ශණය කිරීම. මෙම තොරතුරු කැළණි ගඟේ දූෂක විභව හඳුනා ගැනීම හා ජල දූෂණය පාලනයට යොදා ගනු ලබයි.

කඩුවෙළ මහ නගර සහා ප්‍රදේශයේ කැළණි ගඟේ ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ තොරතුරු ඇතුලත් ඩිජිටල් නාම පුවරුවක් සවි කිරීම මගින් මහජනතාව දැනුවත් කිරීමට කටයුතු කරනු ලබයි.

2.7.2. ගංගා ඉවුරු පුනරුත්ථාපනය

බාදනයට ලක් වූ කැළණි ගංගා ඉවුර සඳහා ජෛව ඉංජිනේරු තාක්ෂණය හඳුන්වාදෙමින් නියමු ව්‍යාපෘතියක් දොම්පෙ ප්‍රාදේශීය සභාවේ සමනබැද්ද උතුර ග්‍රාම නිලධාර කොට්ඨාශයේ ක්‍රියාවට නැංවුණි. මේ යටතේ බාදනයට ලක් වූ කැළණි ගංගා ඉවුරේ මීටර 100 ක් පුනරුත්ථාපනය කෙරුණි.

2.7.3. 2013 මාර්තු 22 ලෝක ජල දිනය සැමරීම

පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය පවිත්‍ර ගංගා වැඩ සටහන ආරම්භ කළ අතර, බියගම පළාත් පාලන බල ප්‍රදේශයේ පිහිටුවා ඇති අපජලය මුදා හරින කර්මාන්තශාලා වලට දැනුවත් කිරීමේ වැඩමුළුවක් පවත්වන ලදී. මෙම වැඩමුළුවේ දී ගංගාව සම්බන්ධයෙන් ඇති ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීමට සහභාගිවූවන්ට අවස්ථාව දෙන ලදී.

2.7.4. පරිසර කළමනාකරණය හා ජලයේ ගුණාත්මකබව සම්බන්ධ පාසැල් දැනුවත් කිරීම

කැළණි ගඟ අසළ පිහිටා ඇති කඩුවෙළ මහ නගර සභාව, බියගම ප්‍රාදේශීය සභාව, කැළණිය ප්‍රාදේශීය සභාව, පැලියගොඩ නගර සභාව, වත්තල ප්‍රාදේශීය සභාව, වත්තල මාබෝල ප්‍රාදේශීය සභාව ප්‍රදේශ වල තෝරා ගන්නා ලද පාසැල් වල දැනුවත් කිරීමේ වැඩ සටහන් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන, මධ්‍යම පරිසර අධිකාරිය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය යන ආයතන වල සහභාගිත්වයෙන් පැවැත්වුණි. මෙම වැඩ සටහනේ මූලික අභිප්‍රාය වූයේ කැළණි ගඟේ දූෂක ප්‍රභවයන් පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම, සෞඛ්‍ය හා දිගු කාලීන සමාජ ආර්ථික බලපෑම් හා හොඳම ක්‍රමෝපායයන් මගින් දූෂණය අවම කිරීමේ ක්‍රම හඳුන්වාදීමයි.

2.7.5. කැළණි ගංගා ද්‍රෝණියේ ක්ෂේත්‍ර චාරිකා

පවිත්‍ර ගංගා වැඩ සටහන යටතේ ජලයේ ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීමේ කටයුතු වැඩි දුරටත් කරගෙන යෑමේ අදහසින් ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම් ස්ථාන සඳහා ඇති ගැටළු හඳුනා ගැනීම, කැළණි ගඟ දූෂ්‍ය කරන අපජලය එම ගංගාවට එකතු කරනු ලබන ස්ථාන හඳුනා ගැනීම හා ජලයේ ගුණාත්මකභාවය සම්බන්ධ තොරතුරු ස්ථාපනය කළයුතු ස්ථාන හඳුනා ගැනී සිදු කරනු ලබයි.

2.7.6 මහජනතාව හා පළාත් පාලන ආයතන වල සේවය කරන නිලධාරින් දැනුවත් කිරීමේ වැඩ සටහන්

බියගම ප්‍රාදේශීය සභාවේ සහ කඩුවෙළ මහ නගර සභාවේ වැඩමුළු 2 ක් පවත්වා පාරිසරික ගැටළු හඳුනාගත් අතර, කසළ කළමනාකරණය හා ජල දූෂණය සම්බන්ධව දැනුවත් කරන ලදී.

2.8 සෞඛ්‍ය හා සමෘද්ධිය උදෙසා හරිත නගර

සෞඛ්‍ය හා සමෘද්ධිය උදෙසා හරිත නගර යන මෙහෙවර යටතේ පහත ක්‍රියාකාරකම් සිදු කර ඇත.

2.8.1 පියකරු පුරවර වැඩ සටහන

ජනගහන වර්ධනය හා සංවර්ධන ක්‍රියාකාරකම් සමඟ ඇති වූ සංකීර්ණ තත්වයක් ලෙස නාගරීකරණය ගෙනහැර දැක්විය හැකිය. නාගරීකරණය නිසා බොහෝ පාරිසරික, සමාජීය හා සෞඛ්‍ය ගැටළු පැන නැගී ඇත. ඒවා නම් අධික ලෙස කසළ එක්රැස් වීම හා අනිසි ලෙස කසළ බැහැර ලීම, දුර්වල ජල අපවහන පද්ධති හා භූගත ජලය දූෂණය වීම, වාහන තදබදය හා දැඩි වායු දූෂණය, මහා මාර්ග දෙපස නිත්‍යානුකූල නොවන ලෙස ඉදි කිරීම් කටුයුත සිදු කිරීම, ධාරකයින් මගින් පැතිරෙන රෝග ව්‍යාප්තවීම, වනහරණය, අධික පරිසර හානිය, ජෛව විවිධත්වයට හානි වීම හා විනෝදාස්වාදය සඳහා ඇති ඉඩකඩ අවමවීම ආදියයි.

එබැවින් ඉහත ගැටළුවලට විසඳුම් සෙවීමේ දී ඇතිවන අභියෝගයන් හා අවස්ථා හඳුනා ගැනීමට හා නාගරික සැළසුම් වලට පාරිසරික සංඝටකය එක්රැස් කිරීමට පියකරු පුරවර වැඩ සටහන ඇරඹුනි.

- මෙම වැඩ සටහන යටතේ සිදුකළ ප්‍රධාන උප කාර්ය වනුයේ මාකඳුර හා වනාතවිල්ලුවෙහි නගර ආකෘති 3ක් ස්ථාපනය කිරීමයි.
- නාගරික උද්‍යාන 04 ක් සිථාපනය කිරීම - මහරගම, පානදුර, දොඩම්ගොඩ සහ කෑගල්ල
  පොදු ස්ථාන 02 ක පාරිසරික තත්වය නඟා සිටුවීම - බණ්ඩාරගම, ගලිගමුව
- පොදු ස්ථාන 02 ක කසළ කළමනාකරණයට උපකාර කිරීම බලංගොඩ, නැගෙනහිර නුවර ගම්පළාත
- පාරිසරික දැනුවත් කිරීමේ වැඩ සටහන් 02 ක් පැවැත්වීම
- වැලිකන්ද ප්‍රදේශයේ ජ්‍යෙෂ්ඨ පුරවැසිසහභාගිත්වයෙන් පාරිසරික සංරක්ෂණ වැඩ සටහනක් සිදු කිරීම
- නොච්චියාගම හා බලංගොඩ ප්‍රදේශ වල මග දෙපස ගස් සිටුවීම

2.9 කර්මාන්ත හරිතකරණය

කර්මාන්ත හරිතකරණය යටතේ සිදු කරනු ලබන ප්‍රධාන මෙහෙවරයන් පහතින් දක්වා ඇත.

2.9.1. කෘෂිකාර්මික ක්ෂේත්‍රය සඳහා ජාතික ප්‍රතිපත්තියක් මුද්‍රණය කිරිම හා ප්‍රකාශයට පත් කිරීම සහ පිවිතුරු නිෂ්පාදනය

මෙම ප්‍රතිපත්තියහා උපාය මාර්ගය 2012 වර්ෂයේ දී කෘෂිකර්ම අමාත්‍යාංශය හා කෘෂිකාර්මික ක්ෂේත්‍රෙය් අදාල පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් ගොඩ නැංවුණු අතර, එහි අරමුණ වූයේ ජාතියේ ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව තහවුරු කිරීම, සමස්ථ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පාරිසරික කාර්යක්ෂමතාව තහවුරු කිරිම, ස්වභාවික සම්පත් කාර්යක්ෂම හා ඵලදායි කළමනාකරණය තහවුරු කිරීම හා ශ්‍රී ලංකාවට තිරසාර සමාජ ආර්ථික සංවර්ධනයක් ළඟා කර දීමයි.

2.9.2. පිවිතුරු නිෂ්පාදනය සඳහා ජාතික මෙහෙයුම් කමිටුවක් ස්ථාපනය කිරීම

ජාතික පිවිතුරු නිෂ්පාදන ප්‍රතිපත්ති හා උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික මෙහෙයුම් කමිටුවක් පිහිටුවීමේ අරමුණ වූයේ ජාතික පිවිතුරු නිෂ්පාදන ප්‍රතිපත්තිය හා උපාය මාර්ග ක්‍රියාවට නැංවීම, මෙහෙයවීම, පිවිතුරු නිෂ්පාදන සංකල්පය ප්‍රචලිත කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශ සැපයීම, පිවිතුරු නිෂ්පාදන ඇගයීම් පැවැත්වීම, ප්‍රගති සමාලෝචනය හා ජාතික සහ ආංශික පිවිතුරු නිෂ්පාදන ප්‍රතිපත්ති හා උපාය මාර්ග ඵලදායි සහ කාර්යක්ෂම ලෙස ක්‍රියාවට නැංවීම ආදියයි. මෙම කමිටුවේ සංයුතියලෙස අමාත්‍යාංශ 18 ක්, ව්‍යවස්ථාපිත ආයතන 08 ක් හඳුනා ගෙන ඇත.මේ සඳහා ToR පිළියෙළ කොට ඇති අතර කමිටුව පිහිටුවා ඇත.

පළමු මෙහෙයුම් කමිටු රැස්වීම 2013.11.01 වන දින පරිසර හා පුනර්ජනනීය බල ශක්ති අමාත්‍යාංශයේ සප්ත පරිසර මණ්ඩපයේ දී පැවැත්වුණි. දැනට පවත්නා ආංශික ප්‍රතිපත්ති හා උපාය මාර්ග වල ප්‍රගතිය සමාලෝචනය කරන ලදී.

පිවිතුරු නිෂ්පාදනය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සැකසීම ආරම්භ කරන ලද අතර, ක්‍රියාකාරී සැලැස්මේ තේමාගත අංශයන් හඳුනා ගන්නා ලදී. එම තේමාගත අංශයන් පිළිබඳ සාරාංශගත කෙටුම්පත් අදාල පාර්ශ්වකරුවන්ගේ අදහස් දැනගැනීම සඳහා බෙදා හරින ලදී.

2.9.3. ශ්‍රී ලංකාවේ ජාතික හරිත වාර්තාකරණ ක්‍රමයක් ස්ථාපිත කිරීම

හරිත වාර්තාකරණය, නිෂ්පාදන හා සේවා අංශවල තිරසාර ක්‍රියාකාරිත්වය පිළිබඳ තොරතුරු සම්ප්‍රේෂණය කළ හැකි කාර්යක්ෂම සන්නිවේදන මෙවලමකි.

ජාතික හරිත වාර්තාකරණ සම්බන්ධීකරණ කමිටු රැස්වීමක් පැවැත්වූ අතර, එය තව දුරටත් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන තීරණ ගන්නා ලදී. ක්‍රියාකාරී දර්ශකයන් සමාලෝචනය කරන ලදී.

2.9.4. හරිත ප්‍රසම්පාදන සැලසුම හා මාර්ගෝපදේශයන් පිළියෙළ කිරීම හා අවසන් තීරණයකට එළඹීම

හරිත ප්‍රසම්පාදන සැලසුම හා මාර්ගෝපදේශයන් සැකසීමේ අරමුණ වූයේ දැනට පවත්නා බලශක්ති හා මූල්‍ය අර්බුදය මෙන්ම, අනෙකුත් බෝහෝ පාරිසරික ගැටළු වලට මුහුණ දිය හැකි පරිදි පවත්නා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් වැඩි දියුණු කරලීමයි. එසේම මෙම මාර්ගෝපදේශයන් මගින් රටේ දිගු කාලීන තිරසර භාවය ලභා කර ගැනීම සඳහා තිරසර පරිභෝජනය හා පොදු හා පෞද්ගලික අංශයන්ගේ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා රටේ ඇති කැපවීම පෙන්වා දෙනු ලබයි. ජාතික හරිත වාර්තාකරණ ප්‍රසම්පාදන හා ප්‍රතිපත්ති කෙටුම්පත් පිළියෙළ කිරීම සඳහා පාර්ශ්වකරුවන්ට වැඩමුළුවක් පැවත්විය. තේමාගත අංශයන් 09 ක් හඳුනාගත් අතර, එයින් අංශයන් 07 ක් සඳහා වැඩමුළු 07 ක් පවත්වා හරිත වාර්තාකරණ මාර්ගෝපදේශ සැකසීය.

2.9.5. තිරසර පාරිසරික තාක්ෂණික ක්‍රමවේදයන් වලට අනුගතවීම සඳහා කර්මාන්තකරුවන්ට අඩු පොලී මූල්‍ය ක්‍රම (හරිත ණය) ප්‍රවර්ධනය කිරීම

රු. මිලියන 2.4 කට වඩා වැඩි මූල්‍ය ආධාර, දැනට පවත්නා ක්‍රමය HCFC භාවිතා නොවන ඕසෝන් හිතකාමී තාක්ෂණික ක්‍රමවේදයකට පරිවරිතනය කිරීම සඳහා මොන්ට්‍රියල් සංවිධානය ක්‍රියාත්මක කිරීම සඳහා වන බහු පාර්ශ්වීය පදනම මගින් අනුමත කරන ලද සිංගර් ශ්‍රී ලංකා සමාගමේ රෙග්නීස් ලංකා PLC හි සාමාජික සමාගමට ලබා දී ඇත.

ක්‍රියාකාරිත්වය ඉතා හොඳින් අධීක්ෂණය කරන අතර එමගින් අපේක්ෂිත ඉලක්කයට ළඟා වනවා දැයි නිරීක්ෂණය කරමින් අඩුපාඩු පිරවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබයි.

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලය හා අනෙකුත් පාර්ශ්ව ආයතන හා සහයෝගයෙන් HCFC ලබා ගන්නා අයවලුන් අධීක්ෂණය හා නීත්‍යානුකූල නොවන ආනයනය පාලනය කරනු ලබයි.

IPIC සමඟ එකතු වීම සහ යාවත්කාලීන වීම නියාමන පද්ධතීන් පිළිබඳ සුපරීක්ෂාකාරීව සිටීමට අදාල ආයතන වලට යොදාගත හැකි කාර්යක්ෂම යාන්ත්‍රණයකි. මේ මගින් කර්මාන්ත වලට අදාල නියාමන ක්‍රමවේදයන්ට අනුගතවීමට හා රටේ පවත්නා හදිසි පාරිසරික තත්වයන්ට අනුව කටයුතු කිරීමට අවස්ථාව සැලසෙනු ඇත.

2.10 නිවැරදි තෝරා ගැනීම සඳහා දැනුම

නිවැරදි තෝරා ගැනීම සඳහා දැනුම නම් මෙහෙවර යටතේ සිදු කරන ලද ක්‍රියාකාරකම් පහතින් දැක්වේ.

2.10.1 හරිත තරු ප්‍රදානය - 2013

දෙවසරකට වරක් පවත්වනු ලබන හරිත තරු ප්‍රදානය මගින් පාරිසරික අවදානම් පිළිබඳ ප්‍රතිචාර දැක්වීම ඒ පිළිබඳව පෙර සූදානම හා ඒවා පිටු දැකීම යන ඉටු කර ගැනීම් පිළිබඳව සංවිධානය කරනු ලබන ආයතන, රාජ්‍යයන් හා පුද්ගලයින් හඳුනා ගනු ලබයි.

මානවවාදී කටයුතු සම්බන්ධීකරණය කරනු ලබන එක්සත් ජාතීන්ගේ කාර්යාලය, අන්තර්ජාතික හරිත කුරුස සංවිධානය සහ එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩ සටහන හරිත තරු ප්‍රදානය සඳහා නාම යෝජනා කැඳවනු ලබයි. එක් නාම යෝජනාවක් තෝරා ගනු ලැබුණු අතර එය එක්සත් ජාතීන්ගේ සංවිධානයේට තරු ප්‍රදානය වෙත යොමු කරනු ලැබීය.

2.10.2 හරිත ගිණුම්කරණය

රටෙහි ජාතික ගිණුමකරණ පද්ධතියට සිදු කරනු ලබන හානි, සේවාවන් වල සැබෑ දායකත්වය ඒකාබද්ධ කිරීම පිණිස හරිත ගිණුම්කරණ යාන්ත්‍රණය වැඩි දියුණු කර ඇත.

- **වන විද්‍යාත්මක ඇගයීම් අධ්‍යයනය**

මෙහි මූලික පියවරක් වශයෙන් රටෙහි ජාතික ආර්ථිකයට වන විද්‍යා අංශයේ දායකත්වය තක්සේරු කිරීමට තීරණය කර ඇත. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයට වන විද්‍යා අංශයේ මුළු තක්සේරු වටිනාකකම එකතු කිරීමට ක්‍රමවේදයක් වැඩි දියුණු කිරීමත් හරිත ගිණුම්කරණ දත්ත ඇතුලත් කිරීමට යාන්ත්‍රණයක් ඇති කිරීමත්ය. ඒ අනුව පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් මෙම කර්තව්‍ය ඉටු කර ගැනීම සඳහා උපදේශක කණ්ඩායමක් පක් කර ඇත. උපදේශක කණ්ඩායම විසින් අවසන් වාර්තා පිළියෙළ කිරීම සිදු කර කිහිපවාරයක් ජාතික මෙහෙයුම් කමිටුව වෙත යොමු කර ඇත. අවසන් වාර්තාව ඇගයීම පිණිස තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත බාර දී ඇත

- **ධාරිතා ගොඩ නැංවීමේ වැඩ සටහන්**

රාජ්‍ය අංශය, අධ්‍යයන ක්ෂේත්‍රෙය් නියැලෙන්නන්, රාජ්‍ය නොවන සංවිධාන සහ අනෙකුත් පාර්ශ්වකරුවන්හට ශ්‍රී ලංකාවේ හරිත ගිණුම්කරණ යාන්ත්‍රණය පිළිබඳව දැනුවත් කිරීම සඳහා ධාරිතා වර්ධනය කිරීමේ වැඩ සටහනක් 2013.12.13 දින දී පවත්වනු ලැබීය.

2.10.3 හරිත ගිණුම්කරණය

දේශගුණ විපර්යාස වල අහිතකර බලපෑම් පිළිබඳව පොදු ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් 2013 අප්‍රේල් 22 වන දින මිහිතල දින පා ගමන සංවිධානය කරනු ලැබීය. මෙම පා ගමන සඳහා රාජ්‍ය සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශයේ සංවිධායකයින්, පාසැල් සිසුන්, රාජ්‍ය ආරක්ෂක සේවයේ නිලධාරින් යන සියළුම

පාර්ශ්වකරුවන් 2000 කට වැඩි පිරිසක් සහභාගි විය. බස්නාහිර පලාත් සභාවේ පරිසර අමාත්‍ය ගරු උදය ගම්මන්පිල මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් බත්තරමුල්ල කිඹුලාවල හන්දියේ සිට ජනකලා කේන්ද්‍රය තෙක් මෙම පා ගමන පවත්වනු ලැබීය.

2.10.4 තිරසාර සංවර්ධනය පිළිබඳව දැයට කිරුළ ප්‍රදර්ශනය හා දැනුවත් කිරීම

දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය 2013 මාර්තු මස 23 – 30 දක්වා අම්පාර හාඩි තාක්ෂණික විද්‍යාලයීය භූමියේ දී පවත්වනු ලැබීය.

අමාත්‍යාංශයේ තිරසර සංවර්ධන හා දේශගුණ විපර්යාස යන අංශ 2 හි මූලිකත්වයෙන් ප්‍රදර්ශන භූමිය තුල පාරිසරික තොරතුරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කරන ලදී. පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය මගින් ප්‍රකාශයට පත් කරන ලද සියළුම ප්‍රකාශන පාසැල් සිසුන් ඇතුළු පොදු ජනතාවගේ දැනුවත් කිරීම සඳහා ප්‍රදර්ශණය පිණිස තබන ලදී.

2.10.5 සොබා සඟරාව බෙදා හැරීම

වෘත්තීයවේදීන්, පරිසරවේදීන් සහ විශ්ව විද්‍යාලයීය සිසුන් විසින් රචිත ලිපි වලින් සමන්විත සොබා සඟරාවේ පිටපත් 2500 ක් පුස්තකාල, පර්යේෂණ ආයතන හා පාසල් අතර බෙදා දෙන ලදී.

2.10.6 ලෝක පරිසර දිනය සැමරීම

සෑම වසරකම ජූනි 05 දින පරිසර පා ගමන්, රුක් රෝපණ වැඩ සටහන් සහ පරිසර සංවර්ධන වැඩ සටහන් වැනි වැඩ සටහන් පවත්වනු ලබන අතර එහි මූලික අරමුණ වනුයේ පරිසර සංරක්ෂණය පිළිබඳව පොදු ජනතාවට පුළුල් ප්‍රචාරයක් ලබාදීම තුලින් දැනුම්වත් කිරීමයි.

- පරිසර නියමු වැඩ සටහනට අදාල ජනාධිපති පදක්කම් ප්‍රදානය කිරීමේ උත්සවය

පරිසරය සඳහා කරනු ලබන කැප කිරීම සඳහා ගරු කිරීමක් වශයෙන් හා මාතෘභූමියේ ස්වභාවික පරිසරය කෙරෙහි දක්වන කැපවීම වෙනුවෙන් පරිසර නියමුවන්ට ජනාධිපති පදක්කම් ප්‍රදානය කරනු ලබයි. දිස්ත්‍රික්ක 12 ක පාසැල් 23 ක සිටින පරිසර නියමුවන් 23 දෙනෙක් සඳහා අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් ජනාධිපති පදක්කම් ප්‍රදානය කරනු ලැබීය.

- පරිසර හිතකාමී ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමේ දීප ව්‍යාප්ත තරඟය සඳහා සහතිකපත් හා ත්‍යාග ප්‍රදානය කිරීම

රට වටා පිහිටි සියළු පාසල් වල පරිසර නියමුවන් සඳහා සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පරිසර හිතකාමී ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම වෙනුවෙන් තරඟයක් පවත්වන ලදී.
දීප ව්‍යාප්ත ජයග්‍රහකයන් වෙනුවෙන් පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා විසින් සහතිකපත් හා ත්‍යාග ප්‍රදානය කරන ලදී.

- දීප ව්‍යාප්ත පෝස්ටර් නිර්මාණ තරඟය සඳහා සහතිකපත් හා ත්‍යාග ප්‍රදානය කිරීම

පරිසර සංරක්ෂණය කෙරෙහි තරුණ පරම්පරාවේ දැනුම කුසලතා හා ආකල්ප වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව කාණ්ඩ 2 ක් යටතේ පෝස්ටර් තරඟයක් පවත්වන ලදී. මෙහිදී අදාල සහතික පත් හා ත්‍යාග පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා විසින් ප්‍රදානය කරන ලදී.

- පරිසර නියමු වැඩ සටහන වෙනුවෙන් සිදු කරන ලද අගනා මෙහෙය වෙනුවෙන් ගුරුවරුන් අගය කිරීම

මධ්‍යම පරිසර අධිකාරිය මගින් පවත්වනු ලබන පරිසර නියමු වැඩ සටහන සඳහා කුරුණෑගල, හම්බන්තොට, කළුතර හා කොළඹ දිස්ත්‍රික්ක නියෝජනය කරන ලද ගුරුවරුන් පස් දෙනෙකුගේ අගනා සේවයට ගරු කිරීමක් වශයෙන් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා අතින් සිහිවටන ප්‍රදානය කරන ලදී.

- ශ්‍රී ලංකාවට ඇති පාරිසරික අභියෝග හා වර්තමානයේ ඇති ගැටළු සම්බන්ධයෙන් වූ දැනුවත් කිරීමේ මෙවලම් බෙදා හැරීම

පරිසර සංරක්ෂණය හා ආරක්ෂණය සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටළු පිළිබඳව සිසුන් දැනුවත් කිරීම අරමුණු කර ගනිමින් විවිධ තේමා යටතේ ඇති පත්‍රිකා හා පෝස්ටර් ඔවුන් අතරේ බෙදා හරින ලදී

- සංස්කෘතික අංග

විවිධ ජාතීන් නියෝජනය කරමින් කොළඹ විශාකා විද්‍යාලයේ, කොළඹ රාමනාදන් හින්දු බාලිකා විද්‍යාලයේ හා හොරණ අධ්‍යාපන කලාපයේ සිසුන් ගේ සහභාගිත්වයෙන් ලෝක පරිසර දිනයේ දී සංස්කෘතික වැඩ සටහන් වේදිකා ගත කරන ලදී

- ජන මාධ්‍ය හරහා සිදු කරන ලද ක්‍රියාකාරකම්

ලෝක පරිසර දිනයේ තේමාව වන ‘‘ආහාර පරිභෝජනයේ අරපිරිමැස්ම ගැන සිතන්න. ඔබගේ ආහාර පිය සටහන අඩු කරන්න‘‘ යන පණිවිඩය ජනමාධ්‍ය ඔස්සේ විසුරුවා හරින ලදී

ලෝක පරිසර දිනය සම්බන්ධයෙන් ලියවුණු ලිපි ලක්බිම, දිවයින, රිවිර, මිහිතලය සඟරාව හා විදුසර පුවත් පත් මගින් ප්‍රකාශයට පත් කරන ලදී.

ස්වාධීන රූපවාහිනී සේවයේ සිව්මංසල, ඇතුලාන්තය වැඩ සටහන, ටී එන් එල් සේවයේ 3ඩී වැඩ සටහන, සිරස රූපවාහිනී සේවයේ සුබ උදෑසන වැඩ සටහන හා ශ්‍රී ලංකා ගුවන් විදුලි සේවයේ සොබා කෙතයන වැඩ සටහන තුලින් ලෝක පරිසර දිනය මූලික කරගෙන සාකච්ඡා පවත්වන ලදී.

දිවයින, රිවිර හා ඩේලි නිව්ස් පුවත් පත්වල ලෝක පරිසර දිනය සම්බන්ධයෙන් දැන්වීම් පළ කරන ලදී.

- දීප ව්‍යාප්ත පරිසර නියමු වැඩ සටහන

මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය පරිසර නිලධාරින්ගේ සහය ඇතිව දීප ව්‍යාප්තව ඒකාබද්ධ වැඩ සටහනක් සංවිධානය කරන ලදී.

කසළ කළමනාකරණ වැඩ සටහන හා රුක් රෝපණ වැඩ සටහන සම්බන්ධයෙන් දීප ව්‍යාප්තව සිසුන් දැනුවත් කිරීම සඳහා ලෝක පරිසර දිනයේ දී විනාඩි 15 ක කතාවක් පවත්වන ලදී.

- දීප ව්‍යාප්ත පරිසර සංරක්ෂණ වැඩ සටහන

ශ්‍රී ලංකාවේ සියළුම පාසැල් සිසුන් පරිසර සංරක්ෂණ වැඩ සටහන් වලට උනන්දු කිරීමට සහ ඒ සම්බන්ධව දැනුවත් කිරීමට දීප ව්‍යාප්තව පාසැල් තුල පරිසර සංරක්ෂණ වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩ සටහන සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් චක්‍රලේඛයක් ද නිකුත් කර ඇත.

- පළාත් පාලන ආයතන හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් පරිසර සංරක්ෂණය හා දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම.

පරිසර සංරක්ෂණය කෙරෙහි පොදු ජනතාවගේ සහභාගිත්වය වැඩි දියුණු කිරීමේ අරමුණින් දීප ව්‍යාප්තව පළාත් පාලන ආයතන හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිසර සංරක්ෂණ හා දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්වන ලදී.

2.10.7 පරිසර සතියේ ක්‍රියාකාරකම්

- මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය පරිසර නිලධාරින්ගේ හා අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගයෙන් යුතුව පරිසර දිනයේ තේමාව සැමරීම සඳහා දීප ව්‍යාප්තව සියළුම පාසැල්වල විනාඩි 15 ක වැඩ සටහන් පවත්වන ලදී.
- ප්‍රධාන උත්සවය හා සමගාමීව දීප ව්‍යාප්තව රුක් රෝපණ හා කසළ කළමනාකරණ වැඩ සටහන් පවත්වනු ලැබූ අතර එහි එක් පියවරක් ලෙස පාසැල් 24 ක් තෝරා ගෙන කසළ බඳුන් බෙදා දෙන ලදී.
- මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය හා එක්ව රත්නපුර දිස්ත්‍රික්කයේ අත්හැර දමන ලද මැණික් පතල් වසා දැමීමේ ව්‍යාපෘතිය 2013 ජූනි මස 06 දින ආරම්භ කරන ලදී. මෙම වැඩ සටහන සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් කුරුවිට ප්‍රදේශයේ දී ආරම්භ කරන ලදී.
- වන විනාශය හා වන හායනය හේතු කොට ගෙන පිටවන හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සම්බන්ධයෙන් වූ ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා වැඩමුළුවක් පැවැත්වීම
- පතල් කර්මාන්තයේ යෙදුනු කර්මාන්කරුවන් හට විශේෂ දැනුවත් කිරීමේ වැඩ සටහනක් පවත්වන ලදී.
- 2013 ජූනි මස 08 වන දිනට යෙදෙන සාගර දිනය දෙහිවල සත්ව උද්‍යානයේ දී පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාගේ සභාපතිත්වයෙන් පවත්වන ලදී. එම උත්සවය පාසැල් සිසුන්, විශ්ව විද්‍යාල සිසුන්, රාජ්‍ය නිලධාරින් හා ප්‍රජා සහභාගිත්වයෙන් සිදු කරන ලදී.
- සූර්ය බලශක්ති වීදි ලාම්පු පද්ධති හඳන්වා දීමේ වැඩ සටහන යටතේ නුගේගොඩ ගුවන් පාලම සඳහා සූර්ය බලශක්ති වීදි ලාම්පු 40 ක් සවි කරන ලදී .
- ඕසෝන් ස්ථරය ආරක්ෂා කිරීමේ නව තාක්ෂණික ක්‍රමවේද පිළිබඳව වැඩ සටහනක් පුහුණු කරවන්නන් පුහුණු කිරීමේ අරමුණ මූලික කරගෙන මොරටුව තාක්ෂණික විද්‍යාලයේ ගුරුවරුන් සඳහා පවත්වන ලදී.
- ලෝක පරිසර දිනයට සමගාමීව රාජ්‍ය දැව සංස්ථාව විසින් තුරුජන සිසු බැංකු ශාක රෝපණය කිරීමේ වැඩ සටහන ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩ සටහන නැති වී යන කළුවර ශාකය සංරක්ෂණය කරමු යන තේමාව යටතේ දිස්ත්‍රික්ක 5 ක් නියෝජනය කරමින් පහත දැක්වෙන පාසැල් පහ තුල පවත්වන ලදී.
    - i. පොළොන්නරුව මෛත්‍රීපාල විද්‍යාලය
    - ii. අම්පාර නාමල්ඔය විද්‍යාලය

iii. කොළඹ ධර්මපාල විද්‍යාලය
iv. කුරුණෑගල ධම්මානන්ද විද්‍යාලය
v. මාතර තෙලිජ්ජවිල කණිෂ්ඨ විද්‍යාලය

මෙම තුරු ජන සිසු බැංකු වැඩ සටහන යටතේ පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී

i. කෘෂිකාර්මික උපකරණ ප්‍රදානය කිරීම
ii. වන වගාව පිළිබඳ පොත් පිරිනැමීම
iii. පරිසරය පිළිබඳ දේශනයක් ඉදිරිපත් කිරීම
iv. වන වගා ස්ථාපිත කිරීම
v. කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහනක් පැවැත්වීම

- මා ඔය ගං ඉවුරු ව්‍යාපෘතියේ වැඩ සටහන් ගම්පහ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා විසින් 2013 ජූනි 11 දින ආරම්භ කරන ලදි.
- කටාන ප්‍රදේශයේ පාසැල්වලට පරිසණක උපාංග හා පාසැල් උපකරණ ප්‍රදානය කරන ලදී.
- භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීමේ කාර්යාංශය හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ බලපත්‍රලාභීන් හා පොදු ජනතාව කේන්ද්‍ර කර ගෙන දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්වන ලදී.
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ හා රාජ්‍ය දැව සංස්ථාවේ සහභාගිත්වයෙන් වන වගා වැඩ සටහන් හා රුක් රෝපණ වැඩ සටහන් මාලාවක් තෝරා ගත් පාසැල් කිහිපයක ක්‍රියාත්මක කරන ලදී.

දැයට කිරුළ වැඩ සටහන සම්බන්ධීකරණය කිරීම

මහින්ද චින්තන ඉදිරි දැක්ම ඔස්සේ, මහජනතාවගේ අවධානය යොමු කිරීම පිණිස දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය සංවිධානය හා අනෙකුත් සංවර්ධන වැඩ සටහන් සංවිධානය කිරීම, පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතන සමඟ එක්ව ප්‍රවර්ධන සහ පරිසර අධ්‍යාපන අංශයේ මූලිකත්වයෙන් සිදු කරයි.

විවිධ පාරිසරික සංවර්ධන වැඩ සටහන් හා පරිසරය සම්බන්ධව ඇති අවධානය වැඩි දියුණු කිරීමට මෙන්ම දැනුවත්භාවය වැඩි කිරීමට ද මෙම සංවර්ධන ප්‍රදර්ශනය ඉවහල් වේ.

- තිඹිරිගොල්ල මහා විද්‍යාලයේ ගොඩනැගිලි නව්‍යකරණය කිරීම
- දෙහිඅත්තකණ්ඩිය කුඩාගල මහා විද්‍යාලයේ පානීය ජල ව්‍යාපෘතියක් ස්ථාපිත කිරීම
- මඩකලපුව, පොන්ඩුකල්වෙනයි ජනාධිපති විද්‍යාලයට අඩි 80 X අඩි 25 ප්‍රමාණයේ අංග සම්පූරණ පාසලක් සපයා දීම
- අම්පාර සහ දෙහිඅත්තකණ්ඩියේ හඳුනාගත් පාසල් 03 ට මූලික පහසුකම් හා විද්‍යාගාර පහසුකම් සපයාදීම
- යුද්ධයෙන් ආබාධිත වූ රණවිරු R Se W G G L G ධර්මරත්න හට නිවසක් සපයාදීම

කොම්පෝස්ට් ව්‍යාපෘති 04 ක් ආරම්භ විවෘත කරන ලදී. - මහඔය ප්‍රාදේශීය සභාව
- පදියතලාව ප්‍රාදේශීය සභාව
- නාමල්ඔය ප්‍රාදේශීය සභාව

- වැලිකන්ද මධ්‍ය මහා විද්‍යාලයේ පාසැල් පුස්තකාලයක් ස්ථාපිත කිරීම
- ත්‍රිකුණාමලය, මඩකලපුව හා අම්පාර දිස්ත්‍රික්ක වල වෙරළාශ්‍රිත පාසැල් සඳහා සමුද්‍ර තොරතුරු අංශයක් ස්ථාපිත කිරීම

2.10.9 වාහන දුම් පරීක්ෂා වැඩ සටහන ක්‍රියාත්මක කිරීම හා වායු සම්පත් කළමනාකරණ වැඩ සටහන් බල ගැන්වීම

- පාරිසරික වශයෙන් තිරසාර ප්‍රවාහන සේවයක් සඳහා වූ පුහුණු වැඩ සටහන
- තිරසාර ප්‍රවාහන සේවයක් වැඩි දියුණු කිරීමේ වැඩමුළුවක් 2013 දෙසැම්බර් 10 වන දින කොළඹ ටාජ් සමුද්‍ර හෝටලයේ දී අදාළ පාර්ශ්ව ආයතන 35 ක සහභාගිත්වයෙන් පැවැත්වුණි.

* පාරිසරික පොලිසිය හා රථවාහන පොලිස් නිලධාරින්හට දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම

වායු විමෝචන තත්ව පරීක්ෂා කිරීමේ වැඩ සටහන හා වායු තත්ව පරීක්ෂා කිරීමේ වැඩ සටහන් රත්නපුර, ත්‍රිකුණාමලය, පොළොන්නරුව, කෑගල්ල, අම්පාර සහ තංගල්ල පොලිස් ස්ථාන 06 ක පැවැත්වුණු අතර පරිසර හා රථවාහන පොලිස් නිලධාරින් 600 ට අධික පිරිසක් අතර වායු දූෂණය පාලනය හා වායු විමෝචන තත්ව පරීක්ෂා කිරීම සම්බන්ධව දැනුම බෙදා දෙන ලදී.

- ඉන්ධන තත්වය වැඩි දියුණු කිරීමේ වැඩමුළුව

ඉන්ධන වල ගුණාත්මක බව හා වාහන වලින් පිටවන දුම්වල තත්වය පාලනය කිරීමේ වැඩමුළුවක් 2013 ඔක්තෝම්බර් 31 වන දින පාර්ශ්වකරුවන් 125 ක ගේ සහභාගිත්වයෙන් කොළඹ ටාජ් සමුද්‍ර හෝටලයෙහිදී පැවැත්වුණි.

- පාරිසරික වශයෙන් තිරසාර වූ ප්‍රවාහන සේවයක් සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩ සටහන මාර්තු 13 – 14 දින වල අනුරාධපුර තලාව හිදී පොලිස් නිලධාරින් 15 කගේ සහභාගිත්වයෙන් 2013 පා පැදි සවාරියට සමගාමී ව පවත්වන ලදී.

2.10.10 පුහුණු කරන්නන් පුහුණු කිරීමේ ජාතික මට්ටමේ සහ පළාත් මට්ටමේ දැනුවත්කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම

2015 ජූනි 10 – 12 දිනවලදී ගරු අමාත්‍ය සුසිල් ප්‍රේම ජයන්ත මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මොරටුව ජර්මන් තාක්ෂණික පුහුණු කිරීමේ ආයතනයේ දී ශීතකරණ හා වායු සමීකරණ පාරිසරිකව හිතකර ලෙස භාවිතා කිරීම පුහුණු කරන්නන් පුහුණු කිරීමේ කඳවුරක් පැවැත්වුණි. මෙහිදී පළාත් 08 ට අදාළව ඇති තාක්ෂණික විද්‍යාලවල උපදේශකයින් 29 දෙනෙකු පුහුණුකරුවන් වශයෙන් පුහුණු කරන ලදී.

මෙම ජාතික මට්ටමේ පුහුණුකරුවන් දීපව්‍යාප්ත තාක්ෂණික ශිල්පීන්ගේ ශීතකරණ හා වායු සමන අංශයන්හි ධාරිතාවය ගොඩනැංවීමේ සම්පත්දායක මඩුල්ලක් ලෙස ක්‍රියා කරනු ඇත. මෙම තත්වය ශීතකරණ හා වායු සමන අංශයන්හි තාක්ෂනික දැනුම ගොඩනැංවීමේ චක්‍රලේඛයන් යාවත්කාලීන කිරීමට උපකාරී වේ.

සිද්ධාන්ත සැසියක් සඳහා ශීතකරණ හා වායු සමීකරණ වලින් පරිසරයට මානව සෞඛ්‍යට ඇතිවන බලපෑම හා යහපත් ශීතකරණ හා වායු සමන පුරුදු පිළිබඳ විෂය කරුණු අඩංගු වේ.

ප්‍රායෝගික සැසි සඳහා ශීතකාරක ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය, ප්‍රතිසාධනය, සහ HCFC හෝ HFC පදනම් වූ වායු සමීකරණ භාවිතය හා එහි ආරක්ෂාකාරී බව පිළිබඳ දැනුවත් කිරීම පිළිබඳ විෂය දැනුම අන්තර්ගත වේ.

- 2013 වර්ෂයේ ජූනි 13 හා 14 දිනයන්හි ජර්මානු කාර්මික තාක්ෂණික ආයතනයේදී ශීතකරණ හා වායු සමන ක්ෂේත්‍රයේ කාර්මික ශිල්පින් සඳහා උචිත හා වඩා උචිත තාක්ෂණයක් හඳුන්වා දීමේ දෙදින වැඩ මුළුවක් පැවැත්වීම.
- උතුරු පලාතේ කාර්මික ශිල්පින් හා පාර්ශ්වකරුවන් අතර දැනුම හුවමාරු කර ගැනීමේ අරමුණින් යුතුව ජාතික ඕසෝන් ඒකකය මූලිකත්වයෙන් යාපනයේ වෘත්තීය පුහුණු ආයතනයේදී කාර්මික ශිල්පින් 75 දෙනෙකු සඳහා පුහුනු වැඩ මුළුවක් පැවැත්වීම.
- දකුණු පලාතේ ගාල්ල හා මාතර දිස්ත්‍රික්කවල කාර්මික ශිල්පින් 120 දෙනෙකු ඌව පලාතේ බදුල්ල හා බන්ඩාරවෙල දිස්ත්‍රික්කවල කාර්මික ශිල්පින් 52 දෙනෙකු සහ කෑගල්ල දිස්ත්‍රික්කයේ කාර්මික ශිල්පින් 60 දෙනෙකු පුහුනු කිරීම.
- ශීතකරණ හා වායු සමන ක්ෂේත්‍රයේ යහ භාවිතය සඳහා වන පුහුනු වීම් වැඩ මුළුවක් අම්පාර හා මඩකළපුව දිස්ත්‍රික්කවල පැවැත්වීම. මෙහිදී වෘත්තීය පුහුණු අධිකාරියේ, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ සහ පෞද්ගලික අංශයේ නියෝජිතයින් මෙහිදී සහභාගිවන ලදී.
- ශීතකරණ හා වායු සමන ක්ෂේත්‍රයේ පුහුණු හා ආධුනික කාර්මික ශිල්පින් 85 දෙනෙකෙු මඩකලපුවේ සහ සමන්තුරේ පවතින කාර්මික අධ්‍යාපන ආයතන වලට අනුයුක්තකර පුහුණුව ලබාදීම.
- විදුහල්පතිවරුන්ට හා ශිෂ්‍ය නායකයන්ට ඕසෝන් වියන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම. මෙහිදී හොරණඅධ්‍යාපන කලාපයේ පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 300 ඕසෝන් වියන සම්බන්ධ කාරණය පිළිබඳ දැනුවත් කරන ලදී.
- ඕසෝන් වියන ආරක්ෂා කිරීම සම්බන්ධ හරිත තාක්ෂණ අභික්‍රමණය පිළිබඳ වැඩමුළුවක් කිරිබත්ගොඩ විහාර මහා දේවි විද්‍යාලයේ පවත්වන ලද අතර එයට ශිෂ්‍යාවන් 125 දෙනෙකු සහ ආචාර්යවරුන් සහභාගි වන ලදී.
- කොළඹ කාන්තා විද්‍යාලය මගින් පැවැත්වූ ‘‘ස්කයිසෝන්‘‘ විද්‍යා ප්‍රදර්ශනයට ඕසෝන් වියන ආරක්ෂා කිරීම පිළිබඳ දායකත්වය ලබා දීම.
- ගාල්ල දිස්ත්‍රික්කයේ පාසැල් 8 ක ශිෂ්‍ය ශිෂ්‍යාවන් 500 දෙනෙකු ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයීය ශ්‍රවනාගාරයේ දී දැනුවතු කිරීමේ වැඩ සටහනකට සහභාගි කර ගැනීම.
- යාපනය වෙම්බඩි කාන්තා විද්‍යාලයීය ශ්‍රවනාගාරයේ දී ප්‍රාදේශීය අධ්‍යාපන කලාපය මගින් සංවිධානය කරන ලද යාපන දිස්ත්‍රික් දැනුවත් කිරීමේ වැඩ සටහනකට දායකත්වය ලබා දීම
- කාර්මික පාඨමාලා විෂයමාලාවේ පරිසරය හා ඕසෝන් වියන ආරක්ෂා කර ගැනීම සම්බන්ධ ඇතුලත් කළ යුතු විෂය කොටස් හඳුනා ගැනීම සහ ශීතකරණ හා වායු සමන ක්ෂේත්‍රයට අදාලව ඒවා නව්‍යකරණය කිරීම
- අනෙකුත් දියුණු රටවල විෂය ධාරාවට සමගාමීව ශ්‍රී ලංකාවේ ශීතකරණ හා වායු සමන ක්ෂේත්‍රයේ විෂය ධාරාව විමර්ෂනය කිරීම
- යහ භාවිත සමඟ බැඳනු තිරසාර සංවර්ධනය සඳහා වන තොරතුරු සංවර්ධනය සඳහා වන තොරතුරු ජාලයක් සඳහා සන්නිවේදන යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම
- පුද්ගලික සහ වෘත්තියමය ආයතනයන්හි ආර්ථික හා සමාජ සංවර්ධන ක්‍රියාවලියට තිරසාර සංවර්ධන හා සම්බන්ධ මූලධර්ම ඇතුලත් කර ගැනීම ප්‍රවර්ධනය කිරීම

- ඕසෝන් වියන හායනයට ලක් කරන රසායන ද්‍රව්‍ය පිළිබඳ මාර්ගයක දත්ත පද්ධතියක් සැකසීම හා අදාල ආයතන ඒ හා සම්බන්ධ කිරීම (ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලය, ආනයන හා අපනයන දෙපාර්තමේන්තුව)
- ඕසෝන් වියන හායනයට ලක් කරන ද්‍රව්‍ය පිළිබඳ 2013 වර්ෂයේ දත්ත රැස් කිරීම සහ ඒ හා සම්බන්ධ වාර්තාව ඕසෝන් ලේකම් කාර්යාලයට හා බහු පාර්ශ්වීය අරමුදල සඳහා වන ලේකම් කාර්යාලයට ලබාදීම
- ජාතික ඕසෝන් ඒකකය මගින් ලබා දුන් ප්‍රතිචක්‍රීකරණ උපකරන වල භාවිතය පිළිබඳ තොරතුරු විශ්ලේෂණය කිරීම
- EFRASL (Environmental Friendly Refrigilatory Association Sri Lanka) ආයතනය සමඟ ඒකාබද්ධව කටයුතු කිරීම සඳහා මාර්ගසූචක පිළියෙළ කිරීu'

2.10.11 පුහුණු වැඩ සටහන්

- රාජ්‍ය කළමනාකරණ සහකාරවරුන් 21 දෙනෙකු හා කාර්යාල කාර්ය සහායක සේවයේ නියුතු වූවන් 21 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් 2 ක් පවත්වන ලදී
- පරිසණක සාක්ෂරතාවය, රාජ්‍ය මූල්‍ය හා ගිණුම්, රාජ්‍ය අංශයේ ගණකාධිකරණ මෘදුකාංග, යහපාලනය හා කාර්ය සාධන සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩ සටහන්, රාජ්‍ය සේවා පුහුණු ආයතනය, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, මිලෝදා ආයතනය, සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල, කාර්මික තාක්ෂණ ආයතනය, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරිවරුන්ගේ සංගමය, පේරාදෙණිය කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ශ්‍රී ලංකාවේ පාංශු විද්‍යා සංගමය, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය සහ ශ්‍රී ලංකා පදනම් ආයතනය යන අධ්‍යාපන ආයතනයන්හිදී අමාත්‍යාංශයේ නිලධාරින් 42 දෙනෙකු සඳහා පවත්වන ලදී.
- රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන දෙමළ භාෂා පුහුණු වැඩ සටහනෙහි පියවර 2 ක් සම්පූර්ණ කිරීම සඳහා එක් නිලධාරියෙකුට මූල්‍යමය සහාය ලබා දෙන ලදී.
- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයේ දේශීය විද්‍යාපති උපාධිය සඳහා නිලධාරින් දෙදෙනෙකුට මූල්‍යමය සහාය ලබා දෙන ලදී.
- අමාත්‍යාංශයේ නිලධාරින් 66 දෙනෙකු කෙටි කාලීන විදේශීය පුහුණු වැඩ සටහන් හා වැඩමුළු සඳහා සහභාගි විය.
- අමාත්‍යාංශයේ නිලධාරින් 75 දෙනෙකු අන්තර් ජාතික රැස්වීම්, සමුළු හා සම්මන්ත්‍රණ සඳහා සහභාගි විය.

3. ජාත්‍යන්තර සහයෝගිතාවය

ජගත් පරිසර පහසුකම් වැඩසටහනෙහි කේන්ද්‍රීය මධ්‍යස්ථානය ශක්තිමත් කිරීම

- **ජගත් පරිසර පහසුකම් (GEF) ව්‍යාපෘති යෝජනාවලි ඇගයීම හා සහතික කිරීම**

ජගත් පරිසර පහසුකම් (GEF) ව්‍යාපෘති සංකල්පයන් / ව්‍යාපෘති යෝජනාවලීන් වැඩි දියුණු කරණු ලබන්නේ අදාල සියළුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය සමඟ උපදේශක මඩුල්ලක ක්‍රියාකාරීත්වයක් තුළින් වන අතර, ජගත් පරිසර පහසුකම් සැලසීම් මහලේකම් කාර්යාලය වෙත යැවිය යුතු අවසන් ව්‍යාපෘති අනන්‍යතා ආකෘතිය පිළියෙල කරනු ලබන්නේ ජගත් පරිසර

පහසුකම්(GEF) කාර්යාලයන්ගේ සහයෝගය ඇතිවය. මෙම යෝජනා වලින් අනුමැතිය ලබා ගැනීම පිණිස ජගත් පරිසර පහසුකම් කේන්ද්‍රීය මධ්‍යස්ථානය වෙත භාර දෙනු ලබයි. ව්‍යාපෘති යෝජනා සඳහා සහතිකය ලබා දීමට ප්‍රථම සියළුම ව්‍යාපෘති හඳුනාගැනීමේ සංකල්ප පත්‍රිකා ප්‍රස්තුත සමාගම් හි කේන්ද්‍රීය මධ්‍යස්ථාන හා ජගත් පරිසර පහසුකම් (GEF) කේන්ද්‍රීය මධ්‍යස්ථානයෙහි සහයෝගය ඇතිව ඇගයීමට ලක්කරන අතර, අනුමැතිය/සහතිකය දෙනු ලබන්නේ ඔවුන් එකඟ වූ ව්‍යාපෘති යෝජනාවලි සඳහා පමණි.

2013 වර්ෂය තුල ජගත් පරිසර පහසුකම් (GEF) මණ්ඩලය විසින් ජගත් පරිසර පහසුකම් සැලසීමේ පස් වන අදියර(GEFcycle V) යටතේ ව්‍යාපෘති අනන්‍යතා ආකෘතිපත්‍ර 3ක් සඳහා අනුමැතිය දෙන ලදි.

* ශ්‍රී ලංකාවේ බලශක්ති නිෂ්පාදනය සහ පරිහරණය කරන්නන් සඳහා කාලානුරූපව ක්‍රියාමාර්ගයන් ලිහිල් කිරීමේ ව්‍යාපෘතිය
* නුවර, නුවර එළිය හා බදුල්ල දිස්ත්‍රික්කයන්හි හායනයට ලක්වූ කෘෂිකාර්මික ඉඩම් නැවත සංවර්ධනය(පුනරුත්තාපනය) කිරීම.
* ජෛව විවිධත්ව ආරක්ෂණය පිළිබඳ කාටිජිනා සම්මුතියට අනුකූල වූ ජාතික ජෛව ආරක්ෂණ රාමුව ක්‍රියාත්මක කිරීම.

- **ජගත් පරිසර පහසුකම් (GEF) ඡන්ද බලය හිමි පාර්ශවකරුවන්ගේ රැස්වීම හා වැඩමුළු සඳහා සහභාගීත්වය**

සෑම GEF මාන්ඩලික රැස්වීමකට ප්‍රථම, ඡන්ද බලය හිමි GEF පාර්ශවකාර රටවල් අතර අරමුදල් බෙදාහැරීමේදී මතුවන ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා ඡන්ද බලය හිමි පාර්ශවකරුවන් විසින් රැස්වීම් පවත්වනු ලබයි. මෙම වැඩමුළු සංවිධානය කරනු ලබන්නේ සාමාජික රටවල මාණ්ඩලික නිලධාරීන්ගේ ඉල්ලීමකට අනුවය. මෙම වැඩමුළු / රැස්වීම් සඳහා සහභාගී වන්නේ ඡන්ද බලය හිමි පාර්ශවකාර රටවල දේශපාලන හා මෙහෙයුම් පිළිබඳ කේන්ද්‍රීය මධ්‍යස්ථානයන් පමණි. මෙමගින් අපේක්ෂා කරන්නේ, පාර්ශවකාර රටවල මාණ්ඩලික සාමාජිකයින් හා ඔවුන්ගේ ඡන්ද බලය හිමි පාර්ශ්වකරුවන් එකිනෙකා මුණගැසීම හා ඔවුන්ගේ ගැටළු සාකච්ඡා කිරීමත්, මාණ්ඩලික රැස්වීම් සඳහා ඡන්ද බලය හිමි පාර්ශව කරුවන්ගේ මතය පැහැදිලි කිරීමත්ය. තවද කවුන්සිලයේ වැඩසටහන පිළිබඳ තොරතුරු බෙදාගැනීම හා ඒ පිළිබඳ ප්‍රතිචාරයන් ලබාගැනීම, රටවල් සහ ඡන්දබලය හිමි පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරන ගැටළු සමාලෝචනය, අසාර්ථක උත්සාහයන් නිවැරදි කිරීම සහ සන්නිවේදනය වැඩිදියුණු කිරීම, මාණ්ඩලික සාමාජිකයින් භාරගැනීමේ පිළිවෙල හා ඡන්ද කොට්ඨාශය මත පාලන විෂයන් නිශ්චය කිරීම, ජගත් පරිසර පහසුකම් (GEF) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාකච්ඡා කිරීම, උගත් පාඩම් පිළිබඳ දැනුම හුවමාරුකර ගැනීම වැනි වැදගත් විෂයන් පිළිබඳ සාකච්ඡා කිරීමද මෙහිදී සිදුකරනු ලැබේ.

ප්‍රසාරිත ඡන්ද හිමි පාර්ශවකාර වැඩමුළු වලින් අපේක්ෂා කරනු ලබන්නේ,ජගත් පරිසර පහසුකම් (GEF) වැඩසටහනේ උපායමාර්ගයන්, ප්‍රතිපත්තීන්, ක්‍රියා පටිපාටීන් සමායෝජනය සඳහා, ජගත් පරිසර පහසුකම් (GEF) වැඩසටහනේ කේන්ද්‍රීය මධ්‍යස්ථානයන්, සම්මුති මධ්‍යස්ථානයන් සහ මහජනතාව ඇතුළු ප්‍රධාන පාර්ශවකරුවන් එකට එකඟතාවයකට පැමිණීමවේ.

මෙම අංගයන් තුලින් කේන්ද්‍රීය මධ්‍යස්ථානයට කලාපයේ අනෙකුත් රටවල ප්‍රතිබණ්ඩිකයින් හා අනෙකුත් ජගත් පරිසර පහසුකම් (GEF) පාර්ශවකරුවන් මුණගැසීමට හැකියාව ලැබෙන අතර ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිය පිළිබඳ සාකච්ඡාකිරීම හා ජගත් පරිසර පහසුකම් (GEF) ව්‍යාපෘති සංවර්ධනයෙන් හා ක්‍රියාත්මක කිරීමෙන් ලද පාඩම් හා අත්දැකීම් පිළිබඳ දැනුම බෙදාගැනීම හා ජාතික ප්‍රතිපත්ති සැකසුම තුල ඔවුන්ගේ සමෝධානය පිළිබඳ සාකච්ඡා කිරීමටද හැකියාව ලැබේ.

ජගත් පරිසර පහසුකම් (GEF)වැඩසටනෙහි කේන්ද්‍රීය මධ්‍යස්ථානය වශයෙන් මෙම අමාත්‍යාංශය ජගත් පරිසර පහසුකම් (GEF) ඡන්ද බලය හිමි පාර්ශවකරුවන්ගේ රැස්වීම් හා වැඩමුළු සඳහා දකුණු හා නැගෙනහිර ආසියානු කලාපීය රටවල් නියෝජනය කරමින් සහභාගී වේ. අවසන් වරට ප්‍රසාරිත ඡන්ද හිමි පාර්ශවකාර වැඩමුළු 2013 මාර්තු 18 සිට 22 දක්වා කාම්බෝජියාවෙහි පැවති අතර අවසන් දකුණු ආසියානු ඡන්දබලය හිමි පාර්ශවකරුවන්ගේ රැස්වීම 2013 ඔක්තෝබර් 28 හා 29 දෙදින භූතානයේදී පවත්වන ලදි.

- **ජාතික ජගත් පරිසර පහසුකම් (GEF) වැඩසටහනෙහි පාර්ශවකරුවන් අතර සංවාදාත්මක වැඩමුළු සංවිධානය කිරීම**

  මෙම සංවාදාත්මක වැඩසටහන් තුලින්, ජගත් පරිසර පහසුකම් (GEF) වැඩසටහනෙහි ප්‍රතිග්‍රාහක රටවලට ගෝලීය පාරිසරික ගැටළු සහ ජගත් පරිසර පහසුකම් (GEF) ප්‍රතිපත්ති සහ ක්‍රියාවලින් පිළිබඳ අවබොධයක් ලබාගත හැකි අතරම, එමඟින් ජගත් පරිසර පහසුකම් (GEF) වැඩසටහනෙහි මූල්‍යමය ක්‍රියාකාරකම් පිළිබඳවද, එම රටවල ප්‍රතිපත්තීන්හි ප්‍රතිඵලයන් පිළිබඳවද අවබෝධයක් ලබාගත හැක. තවදුරටත් මෙමඟින්, පුළුල් පරිසරයක් තුල විහිදුණු මාතෘකා පිළිබඳ අවබෝධයක් ලබාගත හැක. ඒවානම්, මූල්‍යාධාර සඳහා මූලිකත්වය ලබාදෙනු ලබන ව්‍යාපෘතීන්, ජාතික ප්‍රතිපත්ති සහ සැලසුම් සංවර්ධනය කිරීම, ජාතික ජගත් පරිසර පහසුකම් (GEF) සම්බන්ධීකරණය, අන්තර් කාර්‍යාංශවල එකමුතුව සහ සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම සහ ජාතික පාරිසරික සහ තිරසර සංවර්ධන සැලසුම් සහ ක්‍රියාවලි සඳහා ජගත් පරිසර පහසුකම් (GEF) වැඩසටහනෙහි මැදිහත්වීම ප්‍රවර්ධනය කිරීම ඒ අතරින් ප්‍රධානවේ.

  මෙම සංවාදාත්මක වැඩමුළු සඳහා සහභාගී වන පාර්ශව කරුවන්ගේ විවිධාංගීකරණයක් දැකිය හැකි අතර, ඔවුන් රාජ්‍ය නොවන සංවිධාන, සමාජ සංවිධාන, අධ්‍යයන හා පර්යේෂණ ආයතන, පෞද්ගලික අංශයන් සහ ආධාරකරුවන් හා හවුල්කරුවන්ගෙන් සමන්විතවේ.

  ජාතික ජගත් පරිසර පහසුකම් (GEF) පාර්ශව කරුවන්ගේ සංවාදාත්මක වැඩමුළුවක් ශ්‍රී ලංකාවේ පැවැත්වීම සඳහා අවශ්‍ය ව්‍යාපෘති යෝජනාවලියක් පිළියෙල කර, අනුමැතිය ලබා ගැනීම සඳහා ජගත් පරිසර පහසුකම් (GEF) මහලේකම් කාර්යාලය වෙත 2013 වර්ෂයේදී ඉදිරිපත් කල අතර, ඒ සඳහා අනුමැතිය ලැබිණි.

  ඒ අනුව, ජගත් පරිසර පහසුකම් (GEF) ජාතික සංවාදාත්මක වැඩමුළුව 2014 ජූනි මාසයේදී ශ්‍රී ලංකාවේ දී පැවැත්වීමට සියළු කටයුතු සූදානම් කර ඇත.

- **ජගත් පරිසර පහසුකම් (GEF) වැඩසටහ පිළිබඳ ඇනුවත් කිරීමේ වැඩමුළුව සංවිධානය කිරීම**

ජගත් පරිසර පහසුකම් (GEF) ඇගයීමේ කාර්යාලයේ වගකීම් අතරින් ප්‍රධාන වන්නේ දේශීය ආයෝජන ඇගයීම (country portfolio evaluation) එමඟින් රාජ්‍යයන් මට්ටමින් සියළුම රාජ්‍ය (country portfolio) එක්රැස් කිරීම එහි ප්‍රතිපල විශ්ලේෂණය හා ප්‍රගති සමාලෝචනය සිදු කරනු ලබයි. දේශීය ප්‍රායෝගික ඇගයීම (country portfolio evaluation) තුලින් ඉතා වැදගත් තොරතුරු ජගත් පරිසර පහසුකම් (GEF) කවුන්සලය වෙත සපයනු ලබන අතර එමඟින් අදාල ජගත් පරිසර පහසුකම් (GEF) වැඩසටහන හා සම්බන්ධ ක්‍රියාකාරකම් වල ප්‍රගතිය හා ප්‍රතිපලයන් රාජ්‍ය මට්ටමින් විශ්ලේෂණය කර ඇත. තවද එම ක්‍රියාකාරකම් අදාල රටවල්හි ජාතික උපායමාර්ගයන් හා මූලිකත්වයන් සමඟ හා ජගත් පරිසර පහසුකම් (GEF) වැඩසටහනෙහි ගෝලීය පාරිසරික නියෝගයන් හා කොතෙක් දුරට අදාල වන්නේදැයි සලකා බලයි.

ශ්‍රී ලංකාවේ ජගත් පරිසර පහසුකම් (GEF) වැඩසටහන යටතේ (country portfolio evaluation) ජාතික පාර්ශ්වකරුවන්ගේ වැඩමුළුව 2013 අප්‍රේල් මස 24 දින සිනමන්ලේක් සයිඩ් හෝටලයේදී පැවති අතර ඒ සඳහා ජගත් පරිසර පහසුකම් (GEF) වැඩසටහනෙහි ප්‍රධාන විධායක නිලධාරියා සහ පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ගරු ලේකම් තුමා සහභාගි විය.

ගෝලීය විපර්යාස පර්යේෂණ පිලිබඳ දකුණු ආසියා ශාන්තිකර ජාලයේ 25 වෙනි උපදේශන කමිටු රැස්වීම, 5 වන දකුණු ආසියානු උප කලාපීය රැස්වීම හා ව්‍යාපෘති සකස් කිරීම පිලිබඳ වැඩමුළුව - 2013

